

# වෘත්තමාලාව



# වෘත්තමාලාව.

අක්ෂර හා වෘත්ත ශික්ෂාව පිණිස
බොහෝ කාලයකපටන් ව්‍යවහාර කරණ
මෙ නාමි පොත
හැකිප්‍රමණින් ශුද්ධකරවා
පේද්‍රුස් කූරේ විසින් අච්චුගසා ප්‍රසිද්ධකරණ ලදී.

ශ්‍රී බුද්ධ වර්ෂ 2422.

පොතක මිල ශත 50.

COLOMBO.
PRINTED AND PUBLISHED
BY
F. COORAY.

1878.

# වෘත්තමාලාව.

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

1 සොත්ථිද්ධිභූපතිම්හා විබුධමධුකරාසෙවනප්පඞ්කජම්හා
නානාභොගාකරම්හා වණිජමුදු පණීතාපගොඝාකුලම්හා
භූමිත්ථීසෙඛරම්හා විපුලසිරිධනී රජමච්චාතිසාරම්හා
විජ්ජාසින්ධූදධිම්හා මනුජසුරදුමා ජිතිගාමප්පුරම්හා.

මූලභාෂා ද්‍රුතකාව්‍ය සඞ්ඛ්‍යාවූ මේ ආදි ගාථාවෙහි සොත්ථි යන පදය "ස්වස්තිත්‍යස්මින් පදෙ ශක්‍ර බ්‍රහ්ම විෂ්ණු මහේශ්වරාඃ ක්‍රමෙණාධිෂ්ඨිතාඃ නිත්‍යම් මඞ්ගලං වො දිශන්තු" යන මේ පූර්ව වාක්‍යයෙන් ස්වස්ත්‍යක්ෂරාධිෂ්ඨිත ඉන්ද්‍ර චතුර්මුඛ ශ්‍රී රාම රුද්‍ර යන මේ දෙවතාවෝ මඞ්ගල්‍යප්‍රදානය කෙරෙති යනු කී හෙයින් කාව්‍යනායක කාව්‍යකර්තෘන්හා ශ්‍රොතෘජනයාට කල්‍යාණාභිවෘද්ධ්‍යපෙක්ෂී පූර්වොපන්‍යාස කළෝයි.

ජිතිගාමප්පුරම්හා අස්සමො අහු; යනු මෙහි ක්‍රියාකාරක පද සඞ්ඛ්‍යයි- ජිතිගාමප්පුරම්හා, ජිතිග්‍රාමනම් පුරයාකෙරෙන්; අස්සමො ("මුනීනංඨා නමස්සමො" යනුහෙයින් තපස්වින්ට වාසස්ථානවූ) ආශ්‍රමයෙක්, අහු, වී; කෙසේවූ පුරයක්හුකෙරෙත් කෙබඳුවූ තැනෙක්හි කෙබඳුවූ ආශ්‍රම යෙක් වීදයත්.

සොත්ථි, සොභනවූ; ඉද්ධි, සමෘද්ධිඇති හෙවත් රාජවිභූතිඇති; භූපතිම්හා, පෘථිවීශ්වරයන් ඇත්තාවූ; විබුධ, සුධීජනනැමති; මධුකර, භෘඞ්ගයන්ගේ; ආසෙවන, නිරන්තරසෙවනයට; පඞ්කජම්හා, පත්මයක් බඳුවූ; නානාභොග, නොයෙක් උප භොග පරිභොග සම්පත්තීන්ට; ආකරම්හා, උත්පත්තිස්ථානවූ; මුදු, මෘදුවූ හෙවත් අකර්කශවූ; පණීත, උතුම්වූ; වණිජ, වෙළඳුන්ඇති; ආපගොඝා කුලම්හා, සල්පිල් සමූහයෙන් ගැවසී ගත්තාවූ; භූමිත්ථී, මහීකාන්තාවට; සෙඛරම්හා, මුදුන්මල් කඩක් බඳුවූ; විපුල සිරිධනී, මහත් ඓශ්වර්‍ය්‍ය සම්පත් ඇති; රජමච්චාතිසාරම්හා, රාජ මහාමාත්‍යයන්ඇති; විජ්ජාසින්ධු, විද්‍යානැමති නදීන්ට; උදධිම්හා, සමුද්‍රයක්බඳුවූ; මනුජ, ප්‍රාර්ථිතජනයන්ට; සුරදුමා, කල්පද්‍රැමයක් බඳුවූ; ජිතිගාමප්පුරම්හා; ජිතිග්‍රාමනම් පුරයාකෙරෙන්.

2 භූතානන්දකරෙ නිකායනිකරෙ ලඞ්කිස්සරෙජ්ජාකරෙ
යස්මිං සාධු කුලෙ දිවාකරකුලෙ සඤ්ජාතභූපාකුලෙ
දුම්මිත්තා සරණෙ සුමිත්තසරණෙ පුඤ්ඤද්ධිසාධාරණෙ
සංකීළන්තු පුරෙ ජනා පමුදිතා දිබ්බාංව දිබ්බෙ පුරෙ.

මෙහි යස්මිං යනු මතුකියන "ඉජ්ජිතූත විභූතිභාරබරීතො තස්මිං පධා නොදිතා" යන ගාථාවෙහි තස්මිං යනු හා සම්බන්ධ...භූත, සියලුසත්වයන්ට; ආනන්දකරෙ, මහාප්‍රසාදක කරවූ; නිකායනිකරෙ, ගෘහසමූහයෑති; ලකති, ශ්‍රීකාහනාව ට; සරොජකාරෙ, පද්මාකරයක් බඳුවූ; සාධුකුලෙ, බ්‍රාහ්මණ ගෘහපති මහාසාරකුලයන් ඇති; දිවාකරකුලෙ, (අභිගාතවූ) සූර්යවංශයෙහි; සංජාත, උපන්නාවූ; භූපාකුලෙ, පෘථිවිපාලයන් ගෙන් ආකූලවූ; දුම්මතානං, පසමිතුරන්ට; අසරණෙ, පිහිටනුවූ; සම්තාන, ඉෂ්ට මිත්‍රයන්ට; සරණෙ, පිළිසරණවූ; පුඤ්ඤපීවී, කුශලාර්ජිත්ව; සාධාරණෙ, සමානවූ; යස්මිංපුරෙ, යම්පුරයෙක් හි; පමුදිතා, ප්‍රමුදිතවූ; ජනා, සත්වයෝ; දිබ්බපුරෙ, දිව්‍යපුර යෙහි; දිබ්බාඉව, දෙවියන්මෙන්; සංකීළනති, ක්‍රීඩාකෙරෙද්ද.

3 පාකාරසාරවලයී ධවලී විසාලී
ආදිච්චවංසපභවස්ස නරාධිපස්ස
භත්ත තතරජ්ජකුලතොපීරබන්ධවාය
තස්සුප්පදග පහිතා පරිබිංච භාති.

ධවලී, ශුභ්‍රවූ; විසාලී, ප්‍රථුලවූ; සාර, ස්ථිරවූ; පාකාරවලයී, පවුරුවලල්ල; ආදිච්චවංසපභවස්ස, සූර්යවංශොත්භූතවූ; නරාධිපස්ස, නරශ්‍රෙෂ්ඨයාගේ; පීරබන්ධවාය, ස්ථිරබන්ධවපිණිස හෙවත් බන්ධුත්වය නැවත ස්ථිරකරණුපිණිස; භත්තතතරජ්ජකුලතො, භක්ත්‍රරාජ්‍යපරම්පරාවෙන් හෙවත් ශොමවංශයෙන්; තස්ස, ඒනරෙන්ද්‍රයාහට; උප්පදග, දෙනුපිණිස; පහිතා, එලවනලද්දාවූ; පරිබිම්බ, පරිවෙෂමණ්ඩලයක්මෙන්; භාති, බබලන්නිද.

4 යස්ස නෙකවිධයොධවාහිනී සුංසුමාරනිකරෙහි සංකුලා
භාති මෙත්තසලිලෙන පූරිතා වසාකවතකාපුථුදීඝිකාවලී.

යස්ස, යම්පුරයක්හුගේ; නෙකවිධයොධවාහිනී, අනෙකප්‍රකාර භටසෙනාවමෙන්; සුංසුමාරනිකරෙහි, නක්‍රසමූහයාවිසින්; සංකුලා, ගැවසීගත්තාවූ; මෙත්ත, හිතසෞඛ්‍යපලක්ෂණවූ මෛත්‍රියමෙන්; සලිලෙන පූරිතා, ප්‍රසන්නශීතලජලයෙන් පිරුණවූ; වසාකවසාක*, සම්පත්ති රාශියක්මෙන්; පුථු, මහත්වූ; දීඝිකාවලී, පරිඛාවලිතොම; භාති, බබලන්නිද.

5 විසාලබරසම්ං නිරාලම්බනා
ධරාඝො'තරණතා සමනතා ජලනතා
යහිං සාරදෙ නීරදාලි,ච නිච්චං
පීරානෙකපාසාදකූටා ජලන්ති.

* 'වසාකසම්පත්තිරාසි' යනුද, 'නදී සතාසුවාහිනී' යනුද පාඨාන්තරයි.

ගගනං, ගම්භීරයෙක්හි; විසාලඹරසමිං, විසාලවූ ආකාසයෙහි; නිරාලම්බමානා, අනාලම්බවන්නාවූ නොහොත් නොඑල්ලෙන්නාවූ; ධරාය, භූමියට; ඔතරන්තා, බස්නාවූ; සම්භාතා, හාත්පස්හි; ජලන්තා, දිලියෙන්නාවූ; සරදෙ, සරත්කාලයෙහි; නීරදාලීව, මේඝකූටපන්තියක්මෙන්; ථිරා, ස්ථිරවූ; නෙකපාසාදකූටා, නොයෙක්ප්‍රාසාදකූටයෝ; නිච්චං, නිරන්තරයෙන්; ජලන්ති, බබලද්ද.

6 භූපත්වා තපජලප්පතිබිම්බිතානි
තබ්බීථියං උභයපස්ස'නුබද්ධකෙතු
නිච්චං පවාලනදිමුද්ධනි කීළමානා
නානාවිධා ජලචරා'ව විරොචයන්ති.

භූපත්වා, භූමියෙහි පතලාවූ; ආතපජල, සූර්යාතපනැමැති උදකයෙහි; පතිබිම්බිතානි, ප්‍රතිබිම්බිතවූ; තබ්බීථියං, එනගරවීථියෙහි; උභයපස්ස, දෙපාර්ශ්වයෙහි; අනුබද්ධ, බඳනාලද; කෙතු, ධජවලිහු; පවාලනදී, ප්‍රවාල ගඟාවගේ; මුද්ධනි, උපරිභාගයෙහි; නිච්චං, සතතයෙන්; කීළමානා, කෙළිනාවූ; නානාවිධා, අනෙකප්‍රකාරවූ; ජලචරාඉව, මත්ස්‍යයන්මෙන් විරොචයන්ති, භ්‍රාජිතවෙද්ද.

7 ධජවරණ්‍ණුබද්ධා කිංකිණිජාලනාද
සුවිපුලනිලවෙගා වෙල්ලිතා භූපකිත්තිං
පූරනභසි ජලන්තා කොතුමාලා විසාලා
තිදිවසුරගණානං ගීයමානා'ව භන්ති.

ධජවරණ, ධජප්‍රාන්තයෙහි; අනුබද්ධා, බඳනාලද්දවූ; කිංකිණිජාලනාද, රන්රසුදැල්නාදයෝ; සුවිපුල, ඉතාමහත්වූ; අනිලවෙගා, වායුවේගයෙන්; වෙල්ලිතා, චලනකරණලද්දවූ; පූරණභසි, පූර්ණාකාසයෙහි; ජලන්තා, දිලියෙන්නාවූ; විසාලා, විසාලවූ; කොතුමාලා, කෙතනාවලිහු; භූපකිත්තිං, රජුගේ කීර්තිය; තිදිවසුරගණානං, දෙව්ලොව දෙවතාවන්ට; ගීයමානාඉව, ගායනාකරන්නාවුන්මෙන්; භන්ති, විරාජමානවෙද්ද.

8 සුදස්සනීයම්හි මහග්ඝි සඞ්ගණෙ
විභූසිතාට්ටාල විසාලසාලයෙ
මහාකාසාරස්ස විනිජ්ජිතොදිතො
මනොරමෙ තොරණගෙ පුරෙ පුරෙ.

සුදස්සනීයම්හි, සඟපත්දැකුම් ඇති; මහග්ඝිකා, මහාර්ඝවූ; අඞ්ගණෙ, ඇගෑ ඇති; විභූසිත, සරසනලද; අට්ටාල, අවලුගා; විසාල, මහත්වූ; සාලයෙ, ගෘහසමූහයඇති; මහාකාසාරස්ස, ශත්‍රුපුරයට; විනිජ්ජිත, සාධා කළාවූ; උදිත, එහෙයින්ම

බඳු; මනොහරමෙ, සිත්කලුවූ; තොරණ ගොපුරෙ, බහිවාරසහ ගොපුරවාරඇති; පුරෙ, පුරයෙහි.

9 රජෙජන්ති තොරණගණා සිරිදස්සනාය
ආගම්ම නාගභවනා ඉධ'සෙසම්බිම්බං
දිස්වා'ඤ්ඤමඤ්ඤවදනානි විලොකයිත්වා
හො අබ්භුතා'ති පුරවණ්ණිතපන්නගා'ව.

තොරණගණා, තොරණසමූහයෝ; සිරිදස්සනාය, පුර සිරි දක්නාපිණිස; නාගභවනා, රසාතලයෙන්; ආගම්ම, අවුත්; ඉධ, මේපුරයෙහි; අසෙසංබිම්බං, සකලසම්බිඹය; දිස්වා, දැක; අඤ්ඤමඤ්ඤවදනානි, ඔවුනොවුන්ගේ මුහුණු; විලොකයිත්වා, බලා; හො, පින්වත්නි; අබ්භුතාති, ආශ්චර්යයෙකැයි; පුරවණ්ණිත, පුරවර්ණනාකරණලද; පන්නගාඉව, දිව්‍යනාගයන් මෙන්; රජෙජන්ති, විරාජමානවෙද්ද— පුරවණ්ණිත පන්නගාව යනු බාහිරත්ථ සමාස ගර්භකොටඇතිකර්මධාරය සමාසයි.

10 සූරං සුසංකුලතුරඞ්ග ඛුරාවධූත
ධූලිහි ධූසරිතවිත්ථත වීථිමජ්ඣෙ
ආගච්ඡමානමහතී වරදන්ති පන්ති
සඤ්ඣාබ්භමද්දනකරී තමසංහතී'ව.

සූරං, දක්ෂවූ; සුසංකුල, අතිශයින් ආකුලවූ; තුරඞ්ග, අශ්වයන්ගේ; ඛුරාවධූත, ඛුරසඞ්ඝර්ෂණයෙන් නැගාවූ; ධූලිහි, රෙණුන් කරණකොටගෙණ; ධූසරිත, පාඬුවර්ණ ඇති; විත්ථත, පතළාවූ; වීථිමජ්ඣෙ, වීසිමාහතරයෙහි; ආගච්ඡමාන, එන්නාවූ; මහතීවරදන්තිපන්ති, උතුම්වූ ගජපන්තිතොම; සඤ්ඣාබ්භමද්දනකරී, සන්ධ්‍යාවලාමඩනාවූ; තමසංහතීඉව, අන්ධකාර ප්‍රබන්ධයක් වැන්නීද.

11 රුචිරනිඛිලවාස වාරසම්බද්ධමාන
ධජකදලිදුමානං සන්තතාජාලාහි යත්ථ
දිනකරරුචිතාපා පාපුනන්තා ජනොඝා
සතතම'සිරමන්තා නන්දනෙ දෙවතා'ව.

යත්ථ, යම්පුරයෙක්හි; රුචිර, මනොඥවූ; නිඛිලවාසවාර, සියළුගෘහවාරයෙහි; සම්බද්ධමාන, යොදනලබන්නාවූ හෙවත් නගරාලඞ්කාරපිණිස වින්‍යාසකරණලබන්නාවූ; ධජකදලිදුමානං, ධජ හා රම්භා වෘක්ෂයන්ගේ; සන්තත, සිඟිල්වූ; ජාලාහි, ජාලාවන් කරණකොටගෙණ; දිනකරරුචිතාප, සූර්‍යරශ්මිසන්තාපයට; අපාපුනන්තා, නොපැමිණෙන්නාවූ; ජනොඝා, ජනසමූ

ගයෝ; නන්දනෙ, නන්දනෝද්‍යානයෙහි; දෙවතාඉව, දෙවියන් මෙන්; සතතං, නිරන්තරයෙන්; අභිරමන්තා, සිත් ඇලවද්ද.

12 කීළිත්වාන ජලාසයෙසු සතතං තායං පුරවීථියං
නික්ඛන්තා පුථුගජ්ජිතා බහුවිධා මත්තහත්ථිමෙඝාවලී
සාලාමොරපමොදමත්තනච්චිතා නොහොන්ති තෙ සබ්බද
සාරඞ්ගෙපි සපොක්ඛරාවකිරිතෙන තොයෙහි තොසාපයුං

ජලාසයෙසු, වාපිතටාකාදිවූ ජලාශයෙහි; කීළිත්වා, ක්‍රීඩාකොට; සතතං, නිරන්තරයෙන්; තායංපුරවීථියං, ඒ නගර වීථියෙහි; නික්ඛන්තා, නික්මුනාවූ; පුථුගජ්ජිතා, මහත්ගජ්ජනාඇති; බහුවිධා, අනෙකප්‍රකාරවූ; මත්තහත්ථිමෙඝාවලී, මත්ත වාරණ නැමති මෙඝපන්තිහු; සාලාමොරපමොදමත්තනච්චිතා, ගෘහමයූරයන් පමණක් සතුටුකරවූහු; නොහොන්ති, නොවෙත්; තෙ, ඒ හස්තිහු; සපොක්ඛර, ස්වකීයශුණ්ඩාග්‍රයෙන්; අවකිරිත, විසුරුවනලද; තොයෙහි, ජලයකාරණකොටගෙණ; සාරඞ්ගෙපි, චාතකපක්ෂීන්ද; සබ්බද, හැමකල්හි; තොසාපයුං, සතුටුකරවූහු.

13 සදා මන්දවාතෙන සංකම්පයන්තා
සමන්තා ඨිතා පූගසාලා විසාලා
පදිස්සා යහිං සස්සිරිං සොභයිත්වා
සකෙ මත්ථකෙ චාලයන්තීති මඤ්ඤෙ.

යහිං, යම්රජධානියෙක්හි; සදා, හැමකල්හි; මන්දවාතෙන, මන්දමාරුතයෙන්; සංකම්පයන්තා, සොලවන්නාවූ හෙවත් කම්පාකරන්නාවූ; සමන්තාඨිතා, හාත්පසින් සිටියාවූ; විසාලා, මහත්වූ; පූගසාලා, ක්‍රමුකවෘක්ෂයෝ; සස්සිරිං, ඒ පුරශ්‍රිය; පදිස්සා, දැක; සොභයිත්වා, ස්තුතිකොට; සකෙමත්ථකෙ, නිජමස්තකයන්; චාලයන්තීති, කම්පාකරවතියි; මඤ්ඤෙ, හඟිමි.

14 සායං පුරී සිවපුරුත්තම ගන්තුකාමා
පාණීනංවිස්සමදදෙක විසාල සාලා
නිසාතපම්හි භවදුග්ගම දුග්ගමග්ගෙ
ජායාසමිද්ධි සුරසාලනිභා'පි හොති.

සායංපුරී, ඒ මේරාජධානිතොමෝ; සිවපුරුත්තම, උතුම්වූ මොක්‍ෂපුරයට; ගන්තුකාමා, යනුකැමැත්තාවූ; පාණිනං, සත්ව සමූහයාට; විස්සමදද, විශ්‍රාමදායකාවූ; විසාලා, මහත්වූ; එකසාලා, අසදෘශශාලාවක්හාද; නිසාතපම්හි, සංසාර ව්‍යසනනැමති ආතපඇති; දුග්ගම, නපුරුගමන්ඇති; භවදුග්ගමග්ගෙ, සංසාර නැමති දුර්ගමාර්ගයෙහි; ජායාසමිද්ධි, ජායා සම්පන්නාවූ; සුරසාලනිභාපිහොති, කල්පවෘක්ෂයක්හාත් සදෘශවන්නීය.

කිංබහුනා, බොහෝකොට කීමෙන් ප්‍රයෝජනකිම්ද?

15 තුරඞ්ගමුත්තුඞ්ග තරඞ්ගභඞ්ගො
සහත්ථිපොතෙහ වරගපොතො *
උදුරපාකාරම නුඤ්ඤතීරො
විසාලපඤ්චඞ්ගික නාදඝොසො.

තුරඞ්ගම, අශ්වයන් නැමති; උත්තුඞ්ග, උස්වූ; තරඞ්ගභඞ්ගො, රැලබිඳුම්ඇති; සහත්ථිපොතෙහ, ආරූඪගසක්කාමාරීන් සහිතවූ; වරග, හස්තින් නැමති; පොතො, නාවුකාඇති; උදුර, මහත් වූ; පාකාර, ප්‍රාකාර නැමති; මනුඤ්ඤතීරෙ, මනොඥවූ වෙලාන් සඅැති; විසාල, මහත්වූ; පඤ්චඞ්ගිකනාද, පඤ්චාඞ්ගිකතූර්‍යනාද නැමති; ඝොසො, ඝොෂඇති.

16 අනන්තපාසාද මහන්තභූධරෙ
නරාධිපාගාර සුමෙරුභාසුරෙ
හරිඤ්ඤකිත්තින්දු පභාභිසඞ්කුලො
පුරප්පයොවාරිධි රජ්ජතෙ සද.

අනන්තපාසාද, නොයෙක් ප්‍රාසාද නැමති; මහන්තභූධරෙ, මහත් පර්වතඇති; නරාධිපාගාර, රජ්ජඝිර නැමති; සුමෙරු, සුමෙරුපර්වතයෙන්; භාසුරෙ, බබලන්නාවූ; හරිඤ්ඤකිත්ති, න රෙඥ, කීර්ති නැමති; ඉන්දුපභා, චන්ද්‍රප්‍රභායෙන්; අභිසංකුලො, ගැවසීගත්තාවූ; පුරප්පයොවාරිධි, පුර නැමති, ක්ෂීරසාගරය තෙම; සද, හැමකල්හි; රජ්ජතෙ, භ්‍රාජිතවන්නිද.

17 ඉත්ථම්භූතවිභූතිභාරභරිතෙ තස්මිං පධානොදිතෙ
සාමන්තරාජ්ජගතිඤ්ඤමොලිරතනා ලිසෙවිපාදම්බුජො
භූසෙන්තො රතනත්තයං සමකුටෙ කත්වාන චූලාමණිං
ලක්ඛිවාසභුජො පරක්කමභුජො රජාධිරජො අහු.

ඉත්ථම්භූත, මෙයථොක්ත ප්‍රකාරවූ; විභූතිභාර, සම්පත්තිභාරයෙන්; භරිතෙ, පිරුණාවූ; පධාන, මූලරාජධානිවූ; උදිතෙ, එහෙයින්ම ප්‍රසිඬවූ; තස්මිං, ඒ ජයිග්‍රාමනම් පුරයෙහි; සාමන්තරාජ්ජගතිඤ්ඤ, සාමන්ත රජදරුවන්ගේ; මොලිරතන, ශිරොමාණික්‍ය නැමති; අලිසෙවි, භෘඞ්ගයන් විසින් සෙවනාලද්දවූ; පාදම්බුජො, පාදපද්මඇති; රතනත්තයං, රත්නත්‍රය; සමකුටෙ, ස්වකීයොත්තමාඞ්ගයෙහි; චූලාමණිංකත්වාන, ශිරොමාණික්‍යයක්කොට; භූසෙන්තො, ප්‍රසාධනයකරන්නාවූ; ලක්ඛිනිවාස, ශ්‍රීනිවාසවූ; භුජො, බාහුවක්ඇති; රජාධිරජො, ප්‍රධාන රජෙක්වූ; පරක්කමභුජො, පරාක්‍රමබාහුනම් රජෙක්; අහු, වී.

* වරගො සූකරෙ ගජෙ, පොතො නාවාබාලකො—යනාදි අභිධානයි.

18 බාහාපරක්කම පරක්කම බාහු බාහු
මන්ථාචලේන මථිතෙ රිපුසින්ධුගබ්භෙ
තස්මිං නිරන්තර නිවාසකතාපි ලක්ඛී
තස්සෝරුබාහුසිඛරේ වසතීති මඤ්ඤේ.

බාහාපරක්කම, බාහුවික්‍රමයක්ඇති; පරක්කමබාහු, ඒ පරාක්‍රමබාහුනම් රජහුගේ; බාහුමන්ථාචලේන, බාහුනැමති මන්දරපර්වතයෙන්; රිපුසින්ධුගබ්භෙ, ශත්‍රූන්නැමති සමුද්‍රගර්භයෙහි; මථිතෙ, මථනයකළකල්හි හෙවත් ඇල්ලූකල්හි; තස්මිං, එහි; නිරන්තර, හැමකල්හි; නිවාසකතාපි, විසීමකළාවූ; ලක්ඛී, ශ්‍රීකාන්තාව; තස්ස, ඒ රජහුගේ; උරු, මහත්වූ; බාහුසිඛරේ, භුජමස්තකයෙහි; වසතීති, වාසයකරන්නීයයි; මඤ්ඤේ, හඟිමි.

19 ජනෙත්ති සුමිත්තාවිහ දෙවි පතිච්
දිසා පාතුභූතො කමා වඩ්ඪමානො
සදා තෙජවන්තො අයං භූපතිසො
විරාජෙති බාලංසුමාලීව නිච්චං.

ජනෙත්ති, ජනකමාතාවූ; සුමිත්තාවිහාදෙවි, සුමිත්‍රානාම් මහෙසිකානැමති; පතිච්දිසා, පූර්වදිශාවෙන්; පාතුභූතො, පහළවූ; කමාවඩ්ඪමානො, ක්‍රමයෙන් වැඩෙන්නාවූ; සදා, හැමකල්හි; තෙජවන්තො, තෙජස්ඇති; අයම්භූපතිසො, මෙපෘථිවීශ්වරතෙම; බාලංසුමාලීව, තරුණ සූර්‍ය්‍යමෙන්; නිච්චං, සතතයෙන්; විරාජෙති, බබලන්නේයි.

20 ඝුසිතදගජනාදෙ දානසන්දෙහදනො
රිපුදිරදවිභෙද රත්තතොජෝරුදන්තො
පුරයුවති කනෙරු පීනනාමොදචිත්තො
ලසති පුරබනජ්ජං භූපති ගන්ධනාගො.

ඝුසිනද, ඝොසිතඝොසා නැමති; ගජනාදෙ, කුඹනාදඇති; දානසන්දෙහ, දානප්‍රවාහනැමති; දනො, මදජලධාරාඇති; රිපුදිරද, ප්‍රත්‍යර්ථීන්නැමති හස්තීන්ගේ; විභෙද, විදාරණයෙන්; රත්ත, රත්වූ; තොජෝරුදනොතා, තෙජස් නැමති මහත් දළ ඇති; පුරයුවති, අනාඃපුරස්ත්‍රීන්නැමති; කනෙරු, හස්තිනීන්; පීනන සන්තොසකරවූ; අමොදචිත්තො, නිරන්තරයෙන් ප්‍රමුදිතවූ සිත්ඇති; භූපති, පෘථිවීශ්වරනැමති; ගන්ධනාගො, සුරගිවාරණතෙම; පුරබනජ්ජං, පුරනැමති සුරනදියෙහි; ලසති, බබලන්නේයි.

21 අම්භොජාභනිම්මලානනෙ පුණ්ඩරීකං
පුරිවාසසම්භාසුරෙ පුණ්ඩරීකං
සලබ්භාමම්බාරණෙ පුණ්ඩරීකං
සවත්තානම්බුජ වාසගම් පුණ්ඩරීකං.

අච්ඡන, පසම්හූරන්නැමති; ඉභ, හස්තීන්ගේ; නිම්මදනෙ, අභිභවනයෙහි; පුණ්ඩරීකං, ව්‍යාඝ්‍රවිශෙෂයක් බඳුවූ; පුරිවාපි, පුරනැමති තටාකයාගේ; සම්භාසුර, බැබලීමෙහි; පුණ්ඩරීකං, ශ්වෙතපද්මයක්බඳුවූ; සලඞ්කා, සවසිය ලංකානැමති; මහීධාරණෙ, පෘථිවිධාරණයෙහි; පුණ්ඩරීකං, පුණ්ඩරීකනම් දිග්ගජයා බඳුවූ; සවතාතභූජ, නිජභූබාහුජයෙහි; වාසයං, නිවාසයකරන්නාවූ; පුණ්ඩරීකං, ශ්වෙතපද්මාසනසොපචාරයෙන් පුණ්ඩරීකනම්වූ වාග්වනිතාවඇති.

22 භුවිතතයසවසාකං නෙකපච්චත්ථිවසාක-
බුජවනසසිවසාකං දිනදුනොරුවසාකං
පරනරපතිවසාකං මද්දමානොරුවසාකං
නරපතිවරවසාකං සාසනෙ භූමිවසාකං.

භුවිතත, භූමණ්ඩලව්‍යාප්තවූ; යසවසාකං කීර්තිරාශිඇති; නෙකපච්චත්ථිවසාක, නොයෙක් ශත්‍රුසෙනා නැමති; අම්බුජවන, පද්මවනයට; සසිවසාකං, චන්ද්‍රමණ්ඩලයවැනිවූ; දිනදුන, නිඞීනි සත්වයාට දෙන්නාවූ; උරුවසාකං, මහත්දනඇති; පරනපති වසාකං, සතුරුරජ සමූහයා; මද්දමාන, මර්දනය කරන්නා වූ; උරුවසාකං, මහත්ප්‍රඥාඇති; වර, උතුම්වූ; නරපතිවසාකං, නරෙන්ද්‍රවංශය හෙවත් නරශ්‍රෙෂ්ඨතෙම; භූමිවසාකං, මහීමණ්ඩලය; සාසනෙ, අනුශාසනාකරන්නේයි.

යස්සබලූ, යම්රජකුගේ වනාහි.

23 රාජෙති ධීරසබරී සිතියා ජම්මාය
වෙරීසමූහහිම සොසන භානුමාය
සජ්ජනකුමුදවිකාසන මන්දිමාය
ආණා දිසාය විදිසාය නරුත්තමාය.

ධීරසබරී, මෙධයකීනැමති පර්වතයාගේ; සිතියා, සිව්මොජ ම්මාය, භූමියක්වැනිවූ; වෙරිසමූහ, වෛරීසමූහ නැමති; හිම සොසන, තුසාරශොෂණයට; භානුමාය, දිවසකරයාවැනිවූ; සජ්ජන, සත්පුරුෂනැමති; කුමුදවිකාසන, කෞමුදප්‍රබොධයට; මන්දිමාය, නිසාකරයා වැනිවූ; නරුත්තමාය, නරශ්‍රෙෂ්ඨයාගේ; ආණා, ආඥතොම; දිසායවිදිසාය, දිසාදු දිසායෙහි; විරාජෙති, බබලන්නීයි.

24 සාරද නීරද චන්ද මරීචි ඛීරසමුද්ද සමුද්ධිතවීචි
දෙවනදීජල භාසනකාරී රාජති භූපති පණ්ඩරකිත්ති.

සාරදනීරද, සරත්වලාහමෙන්ද; චන්දමරීචි, චන්ද්‍රකිරණයන් මෙන්ද; ඛීර සමුද්දසමුද්ධිත, ක්ෂීරසාගරයෙන් නැගූවූ; වීචි

තාරගණන්මෙන්ද; දෙවනදීජල, ආකාසගංගා ජලයමෙන්ද; හාසනාකාරි, විශෙෂයෙන් බැබලීම කරන්නාවූ; භූපති, පෘථිවීශ්වරයාගේ; පණ්ඩරකිත්ති, ධවලවූ කීර්තිතොම; රාජති, විරාජමාන වන්නීයි.

25 වෙරිවග්ගු තනුසගෙ පටිබද්ධ ගුණෙන
විසාරදණකාදම්බතාලෙ භුවි යස්ස රඤ්ඤො
තෙජොරුබීජවපිතෙ නයනානි කාමං
රත්තුප්පලච්ඡවිගුණං විනිදස්සයිංසු.

භුවි, පෘථිවියෙහි; වෙරිවග්ගු, ශත්‍රුවනිතාවන්ගේ; තනු, දෙහනැමති; සගරපටිබද්ධගුණෙන, තවාන ප්‍රතිබද්ධවූ; විසාරදණ, සිත්නැමති; කාදම්බතාලෙ, කලල්මත්තෙහි; යස්සරඤ්ඤො, යම්රජකෙනෙකුගේ; තෙජ, තෙජස් නැමති; උරු, බොහෝවූ; බීජවපිතෙ, බීජවපුලකල්හි; කාමං, ඒකාන්තාවන්ගේ; නයනානි, නෙත්‍රයෝ; රත්තුප්පලච්ඡවිගුණං, රක්තොත්පලයාගේ; ඡවිවර්ණය; විනිදස්සයිංසු, විශෙෂයෙන් දැක්වූද.

26 සුචරිතාකර දුරිතනාකර යසනිසාකර ගතිනිභො
විභවයාචක නිඛිලයාචක විවිධවාහක මුදසෙනො
අභිතවාරණ නිකරවාරණ සුරභිවාරණ පතිසමො
දසදිසන්තර විතතසුන්දරතර නිරන්තර ඤාතිනන්දෙ.

සුචරිතාකර, සොභනවූ චාරිත්‍රයට ආකරවූ; දුරිතනාකර, අසොභනවූ චාරිත්‍රයට අනාකරවූ; යස, කීර්තියෙන්; නිසාකරගතිනිභො, චන්ද්‍රස්වරූපයක් බඳුවූ; අභිත, වියවගින්නැමති; වාරණනිකර, හස්තිසමූහයාගේ; වාරණ, වැලක්වීමෙහි; සුරභිවාරණ පතිසමො, ගන්ධහස්තිරාජයක් බඳුවූ; දසදිසන්තර, දශදිශාන්තරයෙහි; විතත, පතළාවූ; සුන්දරතර, අතිසයින් සොභායිවූ; නිරන්තර, අතුරු නැතිව පවත්නාවූ; ඤාතිනන්දො, සතුටිභොණාඇති.

27 ගුරු මෙධගාධියා හරි මුගාබලා
රවි තෙමොජගුණා සමිගුං යසසා
රවිවංසධජො නරරාජවරො
ජයතෙ ජයතෙ ජයතෙ ජයතෙ.

රවිවංසධජො, සූර්‍යවංශයට ධ්වජයක්බඳුවූ; නරරාජවරො, නරශ්‍රෙෂ්ඨතෙම; අගාධියා, ප්‍රඥාසහවූ බුද්ධියෙන්; ගුරුං, බ්‍රහස්පතිහු; ජයතෙ, ජයගන්නේයි; උගාබලා, මහත්ශක්තියෙන්; හරිං, විෂ්ණූහු; ජයතෙ, ජයගන්නේයි; තිජගුණා, තොජෝගුණ

යෙන්; රවිං, දිවසකරයා; ජයතෙ, ජයගන්නේය; යසසා, කීර්තියෙන්; හිමගුං, නිසාකරයා, ජයතෙ, ජයගන්නේයි.

28 පුරඹරෙ'නුත්තරරජ වන්දිමෙ
නිරන්තරං ලොක හිතාය භාසුරෙ
පරබ්බුජා සංකුචිතා අහූ සදා
සබන්ධුකුන්ද අභිනන්දිතා අහූ.

පුරඹරෙ, පුර නැමති ආකාශයෙහි; අනුත්තර, නිරුත්තරවූ රජවන්දිමෙ, රජ නැමති චන්ද්‍රයා; නිරන්තරං, සතතයෙන්; ලොකහිතාය, ලොකාභිවෘද්ධියපිණිස; භාසුරෙ, බබලනකල්හි; පරබ්බුජා, ශත්‍රු නැමති පඞ්කජයෝ; සංකුචිතාඅහූ; හැකුළුනාහූ වෙති; සබන්ධුකුන්ද, ස්වකීයබන්ධු නැමති කෛරවයෝ; සදා, හැමකල්හි; අභිනන්දිතාඅහූ, ප්‍රබොධවූවාහූ වෙත්.

29 පුබ්බාජිතිවිතො රුපුඤ්ඤහිසතො ලංකාසරොජාකරෙ
සඤ්ජාතොදසරාජධම්මමධුදො නිසෙසසසත්තාලිනං
භූපාලුත්තමපුණ්ඩරීක මුකුලො ලක්ඛීනිවාසො සදා
සම්පන්නුප්පලවණ්ණදෙව රචිනා සබොධතෙ සන්තතං.

පුබ්බාජිති, පූර්වජිතියෙහි; විත, සංචයකරණලද්දවූ හෙවත් රැස්කරණලද්දවූ; උරු, මහත්වූ; පුඤ්ඤහිසතො, කුසල්නැමති මෘණාලයෙන්; ලංකා, ලංකාවිපනැමති; සරොජාකරෙ, පද්මාකරයෙහි; සංජාතො, හටගත්තාවූ; නිසෙසසසත්තාලිනං, සියලුසත්ව නැමති භෘඞ්ගයන්ට; දසරාජධම්ම, දශරාජධර්ම නැමති; මධුදො, පුෂ්පරසදයකාවූ; සදා, හැමකල්හි; ලක්ඛීනිවාසො, ශ්‍රීනිවාසවූ; භූපාල, පෘථිවිපාල නැමති; උත්තම, උතුම්වූ; පුණ්ඩරීකමුකුලො, ශ්වෙතාරවින්දකුඩ්මලය; සම්පන්න, අධිකසම්පත්තියෙන් සමෘද්ධවූ; උප්පලවණ්ණදෙවරචිනා, උත්පලවර්ණදෙවරාජනැමති සහස්‍රකිරණයා විසින්; සන්තතං, නිරන්තරයෙන්; සබොධතෙ, ප්‍රබොධකරණුලැබේ.

කිංබහුනා, බොහෝකොට කීමෙන් ප්‍රයොජනකවරේද?

30 වෙලාහතාපරිබිම්භි පවනදීපොදරමෙඝාකුලෙ
කල්ලොලබ්භවිරප්පභාවිලසිතෙ සිඩම්බරෙ භාසුරෙ
ලංකාදීපසසංකමණ්ඩලවරෙ මහාභිදතාරාවුතො
රාජිංසං සසිදෙවපුත්තසදිසො හුත්වාසදා රාජතෙ.

වෙලාහත, වෙලාහතනැමති; පරිබිම්භි, පරිවෙෂමණ්ඩලයක් ඇති; පවනදීප, පන්සියක් කොදෙව්නැමති; උදර, මහත්වූ; මෙඝාකුලෙ, මේඝකූටයෙන් ගැවසීගත්තාවූ; කල්ලොල, තරඟ

නෑමති; අබ්භ, වලාහකයන්ගා; අචිරප්පභා, විද්‍යුල්ලතායෙන්; විලසිතො, දිලියෙන්නාවූ; සිඛණ්ඩරෙ, සමුද්‍ර නැමති ආකාශයෙහි; භාසුරෙ, බබලන්නාවූ; ලංකාදීප, ලංකාද්වීප නැමති; සසංක මණ්ඩලවරෙ, උතුම්වූ චන්ද්‍රමණ්ඩලයෙහි; මන්තිඳ, මන්ත්‍රීශ්වරයන්නැමති; තාරවුතො, තාරකාවන් විසින් පිරිවරණලද්දාවූ; අයංරාජා, මේ පරාක්‍රමබාහු රජතෙම; සසිදෙවපුත්ත සදිසො හුත්වා, චන්ද්‍රදිව්‍ය පුත්‍රයා සදෘශව, සදා, හැමකල්හි; රාජතෙ, විරාජමානවන්නේසි.

31 තස්ස පුරස්ස ධජො විය නිච්චං
සිස්සසුභාසිත භාරතිරඞ්ගො
විස්සමනස්සජනස්ස නිවාසො
අස්සමභූමිපදෙසෙපි විරාජෙ.

තස්සපුරස්ස, ඒ ජාතිග්‍රාමනම් පුරයට; ධජොවිය, ධ්වජයක් බඳුවූ; නිච්චං, නිරන්තරයෙන්; සිස්ස, ශිෂ්‍යයන්ගේ; සුභාසිත, ජිනභාෂිතලක්ෂණවූ; භාරති, වාග්වනිතාවට; රඞ්ගො, නාට්‍ය මණ්ඩලයක්වැනිවූ; විස්සමනස්ස, විශ්‍රාමකරන්නාවූ හෙවත් ශ්‍රම සංසිඳුවන්නාවූ; ජනස්ස, සත්වයාට; නිවාසො, ශාලාවක් බඳුවූ; අස්සමභූමිපදෙසෙපි, විහාරභූමිප්‍රදේශයකුදු; විරාජෙ, බබලන්නේසි.

32 සංඝසංඝ වරතාරකාකුලො
දීපවිජ්ජු භවනබ්භභාසුරො
ධම්මරාසිසසිරාජි තස්සමො
තාරකාති දිවනිට්ඨිතො අහු.

සංඝසංඝ, සංඝසමූහ නැමති; වර, උතුම්වූ; තාරකාකුලො, තාරකා සමූහයෙන් ආකුලවූ; දීපවිජ්ජු, ප්‍රදීප නැමති විදුලියෙන්ගා; භවනබ්භ, නිවාසනැමැති වලාහකයෙන්; භාසුරො, බබලන්නාවූ; ධම්මරාසි, ධර්මරාසි නැමති; සසි, ශශාංකමණ්ඩලයෙන්; රාජිත, විරාජිතවූ; අස්සමො, ආශ්‍රමයෙන්; තාරකාතිදිවා, තාරකා දිව්‍යලොකයට හෙවත් චාතුම්මහාරාජිකා දිව්‍යලොකයට; නිට්ඨිතො, නින්දකරන්නේ; අහු, වී.

33 උන්නතුන්නසිඛරෙ සුධාවබිම්බිතා
මඤ්ජුනිලෙන වලම්බනාධජා යහිං
සද්ධම්මඝොෂපවරෙන සුසංගතත්වා
දූරගතා දුරිතාවරීභවන්ති මඤ්ඤෙ.

උන්නතුන්න, උස්වූ; යහිංසිඛරෙසු, යම්විහාරශිඛරයන්හි; අනුබද්ධා, බඳනාලද්දාවූ, මඤ්ජුනිලෙන, මෘදුපවනින්; වලම්බාන, කම්

පාවත්නාවූ; ධජා, ධවජසමූහයෝ; යතිශ, යතීන්විසින්; සඬම්ම, සඬම්මනැමති; යොධපවරෙන, හමොතතමයාලවා; සුසංගහෙතවා, දැඩිකොට අල්වාගෙණ; දූරිකතා, දූරෑකරණලද්දවූ; දුරිතවෙරිභවාභූති, පාපනැමති ශත්‍රුභවයෝයසී; මඤ්ඤෙ, යසිම්.

24 පුගරුකඛනිකරා සුපුප්ඵිතා
ඛඛකොතුදූරීතො විලොකිය
තත්ථ බන්ධනගතං'ව සාධු'ති
හාසකෙන හුතිනා ගසනති'ව.

තත්, ඒ විහාරයෙහි; සුපුප්ඵිතා, මනාවපිපුනාවූ; පුගරුකඛනිකරා, පුගවෘක්ෂසමූහයෝ; ඛඛ, ඛඳනාලද; කොතුදූරීතො, ධවජසංඛ්‍යාත පාපයන්; විලොකිය, බලා; බන්ධනගතං එවසාධුභූති, බන්ධනයට පැමිනියාව යහපතැයි; හාසකෙනහුතිනා, සෑතතාෂයෙන් ප්‍රශංසාකෙරෙමින්; හසනාතිභූව, සිනාසෙන්නාවුන්මෙනි.

25 විභාතෙ ගලනතා ච නිහාරබිඥු
විජ්නං සනිඝොසසාඛිසමූහා
යමිනං තපොතෙජ සාධු'තිවතවා
මුදස්සු වගනතා ‹නිසනතාති මඤ්ඤෙ.

විභාතෙ, ප්‍රත්‍යූෂකාලයෙහි; ගලනතා, ගිලිහෙන්නාවූ නෙත් වගනයවන්නාවූ; නිහාරබිඥු, තුෂාරකණිකාඇති; විජ්ණං, පක්ෂීන්ගේ; සනිඝොසා, රාවප්‍රතිරාවසහිතවූ; සාඛීසමූහා, උපවන වෘක්ෂසමූහයෝ; යමිනං, භාවනානුයොගීන්ගේ; තපොතෙජ, ධ්‍යානභාවනාදී තපොතෙජස; සාධුභූති, යහපතැයි වතවා, කියූහොවුන්කියා; මුදස්සුවගනතා, සතොෂ බාෂ්පජලයන්වගනය කරන්නාවූ ගෙවත් සතුටු කඳුළුහෙලන්නාවූ; නිසනතාභූති, රාත්‍රිඅහතයෝයසී; මඤ්ඤෙ, සිතම්.

26 * ලතාභතථසම්පතනතසම්ඵුලලපුපඵා
ශඛිංපලලවො සපලිපාදපිඥා
සද සාසනාවාර සජාතපෙමා
විනීතාව සිස්සා විරෙවනති නිච්චං.

යහිං, යම්විහාරයෙක්හි; පලලවොනංජලී, කිසලයසමූහනැමති ඇඳිලිඇති; ලතාගතථසම්පතනත, සාඛානැමති හසතප්‍රාප්තවූ; සම්ඵුලලපුපඵා, ඝුත්පුල්ලපුෂ්පයන්ඇති; පාදපිඥා, වෘක්ෂරාජ

* සාඛාකුෂාරිතාලතා-ඝනා නිගණ්ඩුයි.

යෝ, සදා, හැමකල්හි; සාපතාචාර, ශාසනචාරිත්‍රයෙන්; සංයත තපේමා, හමගත්භක්තිඇති; විනිතාසිස්සාභූව, සුවිනිතශිෂ්‍ය යන්මෙන්; නිච්චං, නිරන්තරයෙන්; විරෙජන්ති, බබලන්නාහුද.

87 පච්චූසකාලෙ නදතම්බචූළා
තාපස්සමෙ නිස්සිතසංයමීනං
කිංභාවනඩා සමුපසීතො'ති
සම්බොධයන්තා විය නිච්චකාලං.

පච්චූසකාලෙ, ප්‍රභාතකාලයෙහි; නදතම්බචූළා, රාවයකරන්නාවූ ගෙවත් අඹලන්නාවූ කුක්කුටපක්ෂීහු; තාපස්සමෙ, ඒ විහාරයෙහි; නිස්සිත, නිශ්‍රිතවූ ගෙවත් වාසයකරන්නාවූ; සංයමිනං, තපස්විවරයන්ට; කිං, කිමෙක්ද; භාවනඩා, භාවනාභියොගකාලය; සමුපසීතොත්ති, එලඹසිටියේහොවේද්‍යසි; නිච්චකාලං, හැමකල්හි; සම්බොධයන්තාවිය, සිහිකරවන්නවුන් වැන්නාහුයි.

88 යස්මිං සිතා සඵලනාලිකෙරගා
භොජෙනතා භජ්ජිවාන සදා නවෙමියං
දිබ්බෙ'ව ධම්මෙ තිදිවෙ'පි දුල්ලභෙ
එලෙ ලභිමහා'ති එලා'ව දස්සිතා.

යස්මිං, යම්විහාරයෙක්හි; සිතා, සිටියාවූ; සඵල, ඵලසහිතවූ; නාලිකෙරගා, නාලිකෙරවෘක්ෂයෝ; භොජනතා, පින්වතුන්; භජ්ජිවාන, සෙවනයකොට; මියං, අපි; සදා, හැමකල්හි; නවෙ, නියමයෙන්; දිබ්බෙවධම්මෙ, ලූතාත්මභාවයෙහිම; තිදිවෙපි දුල්ලභෙ, දිව්‍යලොකයෙහිද ලැබගත නොහැක්කාවූ; එලෙල ලභිමහාති, ඵලලබුමහයි; එලාදස්සිතාභූව, ඵලදක්වනලද්දවුන් වැන්නාහුද.

89 සම්බුල්ලම්භනමුකුලාවලිසංකුලානි
චම්පෙය්‍යරුක්ඛනිකරානි මනොහරානි
සම්පූජිතානි යමිනං වනදෙවතාහි
දීපංහිකානි'ව සදා පරිදීපයන්ති.

සම්බුල්ලම්භන, විකසිතවන්නාවූ; මුකුලාවලි, කැකුළුපෙළින්; සංකුලානි, ගැවසීගත්තාවූ; මනොහරානි, මනොඥවූ; චම්පෙය්‍යරුක්ඛනිකරානි, චම්පෙය්‍යවෘක්ෂසමූහයෝ; වනදෙවතාහි, වනදෙවියන් විසින්; යමිනං, සංයමීන්ට; සම්පූජිතානි, පුදනලද්දාවූ; දීපංහිකානිව, පහන් ඇගෑමෙන්; සදා, හැමකල් හි; පරිදීපයන්ති, බබලද්ද.

40 පුප්ඵාවසානසඵලා සහකාරරුක්ඛා
යස්මිං තපොවනතපොධනසංයමිනං
මිගාවසානජඵලම්පීති එවමෙව
තෙසං නිරන්තරමතිංච පදීපයන්ති.

යස්මිං, යම්විහාරයෙක්හි; පුප්ඵාවසානා, පුෂ්පාවසානයට; සඵලා, ඵලසහිතවූ හෙවත් මල්වනපලගෙණ සිටියාවූ; සහකාර රුක්ඛා, මධුරම්බවෘක්ෂයෝ; තපොවන, ඒ විහාරයෙහි; තපොධන, තපස්මධනකොටඇති; සංයමිනං, තපස්වීන්ට; මිගාවසානජ, මෘගාවසානයට උපදනාවූ; ඵලංඅපි, ඵලයද; එවංඑව ඉති, මෙබඳුමයයිසයනි; තෙසං, ඒ තපස්විවරයන්ගේ; නිරන්තරමතිංච, අනවරත බුද්ධියමෙන්; පදීපයන්ති, බබලද්ද.

41 සාරජාතරූපප්පභව දෙවචාපසොභගො
ලොලබාලපල්ලවොඝ ගෙහවිජ්ජුභාසුරො
සෙතකෙතනාවලී බලාකසෙනිසංකුලො
නිගම්මනවාරණො දුමිඳනිරදෙ අහු.

සාර, උතුම්වූ; ජාතරූපප්පභව, ස්වර්ණප්‍රභාවතැමති; දෙවචාප, ඉඳුවාපයෙන්; සොභගො, බබලන්නාවූ; ලොල, කම්පිතවූ; බාලපල්ලවොඝ, ළපලු සමූහතැමති; ගෙහවිජ්ජු, නොයෙක් විදුලිලතායෙන්; භාසුරො, බබලන්නාවූ; සෙත, ධවලවූ; කෙතනාවලී, පතාකපන්තිතැමති; බලාකසෙනි, බලාකාවලියෙන්; සංකුලො, ගැවසීගත්තාවූ; නිසග්ගිම්හ, දුක්තැමති ග්‍රීෂ්මය; වාරණො, වලක්නාවූ; දුමිඳනිරදෙ, බොධිද්‍රුම රාජතැමති මෙඝකූටයෙක්; අහු, වී.

42 සකඅත්ථහිතාපි පරත්ථරතො
ජිනසාසනපාලනසුද්ධමනො
ගුණභූසන භූසනකො ච අහු
උපලතාරමූලමහාථවිරො.

සකඅත්ථහිතාපි, ස්වකීයාර්ථ කරණයටවඩා; පරත්ථරතො, පරාර්ථයෙහි ඇළුම්ඇත්තාවූ; ජිනසාසනපාලන, සර්වඥශාසනය පාලනයකරන්නාවූ; සුද්ධමනො, පවිත්‍රවූසිත්ඇති; ගුණභූසන, ශීලව්‍රතාදිගුණ සංඛ්‍යාතභූසනයෙන්; භූසනකොච, සැරසුනාවූ; උපලතාරමූලමහාථවිරො, ශෛලාන්තරමූල මහාස්ථවිර වරයෙක්; අහු, වී.

43 පජ්ජුන්නුඛිප්පිතොදරබොතතා
තපොතොයසුද්ධකතාසඝනොසො
දගාසිගතෙලසස සොවණ්ණපතොතා
විරාජති සොනාතිමූලථෙරො.

පජා, සත්වයන්ගේ; පුඤ්ඤබීජප්පිතා, කුසල්නැමති බීජනික්ෂේපයෙහි; උදාරඛෙත්තතා, මහත්වූ ක්ෂේත්‍රයක්බඳුවූ; තපොතොයෙ, ධූතගුණාදි තපොජලයෙහි; සුසිත්තා, සුඛකරණලද්දවූ; අසඞ්ගහොහො, පාපතාලුම්භ සමූහඇති; දයා, කාරුණ්‍යනැමති; සීහතෙලස්ස, සිංහතෛලයට; සොවණ්ණපත්තතා, ස්වර්ණභාජනයක්බඳුවූ; සෙනාපති මූලථෙරො, චමූපතිමූල ස්ථවිරතෙම; විරාජති, විරාජමානවන්නේය.

44 සසිස්සගණකණ්ඨාභිතධම්මමාලො
විරාජති රාගාදිපාපපහාරො
ගුණොදාරහාරං නිජොර ධරන්තො
මහානෙත්තපාසාදමූලොරුථෙරො.

සසිස්ස, ස්වකීය ශිෂ්‍යයන්ගේ; කණ්ඨෙ, ග්‍රීවාධරයෙහි; ඔහිතා, බහනලද ගෙවත් පලඳවනලද; අග්ගධම්මමාලො, උතුම්වූ; ධම්මමාලාඇති; රාගාදී, රාගප්‍රතිඝාදිවූ; පාපපහාරො, පව්දුරුකරන්නාවූ; ගුණ, සීලසමාධ්‍යාදි ගුණනැමති; උදාරහාරං, මහත් මුක්තාවලිය; නිජොරෙ, ස්වකීයවක්ෂස්හි; ධරන්තො, දරන්නාවූ ගෙවත් පලඳින්නාවූ; මහානෙත්ත පාසාදමූලොරු ථෙරො, මහානෙත්‍ර ප්‍රාසාදමූල මහාස්ථවිරතෙම; විරාජති, බබලන්නේය.

45 සදාසෙසදෙසීපවත්තොරුමෙත්තො
තිසික්ඛාතුරක්ඛාතිදක්ඛො සපඤ්ඤො
රණානං අවාසො ගුණානං නිවාසො
සරොගාම මූලව්හථෙරො විරාජෙ.

සදා, සැමකල්හි; අසෙසදෙසී, සකලසත්වවිෂයෙහි; පවත්ත, පවත්වනලද; උරුමෙත්තො, ප්‍රචුරමෛත්‍රීඇති; තිසික්ඛාතුරක්ඛා, ත්‍රිවිධශික්ෂාරක්ෂණයෙහි; අතිදක්ඛො, ඉතාසමර්ථවූ; සපඤ්ඤො, සප්‍රාඥවූ; රණානං, පාපයන්ට; අවාසො, වාසස්ථානනොවූ; ගුණානං, ශ්‍රමණගුණයන්; නිවාසො, වාසස්ථානවූ; සරොගාම මූලව්හථෙරො, සරසිගාමමූලාඛ්‍යාත ස්ථවිරතෙම; විරාජෙ, භ්‍රාජිත වන්නේය.——අපරපි, සෙස්සොද.

46 විනයනයවිභාගෙ ජානනෙ තික්ඛපඤ්ඤො
රුචිරවිමලසීලො සාසනානාතජෙතා
කුසලපථානුගාමී සංඝමී සංඝමිසා
සතතංමිහ වසතෙතා ගාම්වාසාධිවාසී.

ඉහ, මේවිහාරයෙහි; විනයනයවිභාග, විනයනයවිභාගයාගේ; ආජානනෙ, දැනීමෙහි; තික්ඛපඤ්ඤො, තීක්ෂණවූ ප්‍රඥාඇති; රු

විර, හඳුවූ; විමල, ප්‍රසන්නවූ; සීලා, ඉන්ද්‍රිය සංවරාදිසිල්ඇති; සාසනත්තාණෙ, ශාසත්‍ර ශාසනාරක්‍ෂායෙහි; ජෙතා, දක්‍ෂවූ; කුසල පථගාමි, කුශලමාර්ගය අනුවයන්නාවූ; සංයමි, කායවාක් සංයමඇති; ගාමවාසාධිවාසී, ග්‍රාමනගරසෙනාසනාධිවාසීවූ; සංයමිසා, සත්ගෙවරයෝ; සතතං, නිරන්තරයෙන්; වසෙනොත, වාසයකෙරෙද්ද.

47 ගුණරතනසමුද්දෙ දීපදීපායමානො
ජනනයන මනුඤ්ඤෙ වාදිමත්තෙභසීහො
ජිනගදිතතිසික්ඛා රක්ඛනාසත්තචිත්තො
වනරතනමහාථෙරපාදෙ විරාජෙ.

ගුණරතන, මෛත්‍රී ක්‍ෂාන්ත්‍යුපශමාදිගුණනැමති රත්නයන්ට; සමුද්දෙ, සාගරයවැනිවූ; දීප, ලංකාවීපයට; දීපායමානො, ප්‍රදීපයක්වැනිවූ; ජනනයන, සත්වයන්ගේ නෙත්‍රයට; මනුඤ්ඤෙ, (රසාංජනයක්මෙන්) මනොඥවූ; වාදී, ලොකාතිප්‍රභාකාරාදි වාදීන්නැමති; මත්තෙභ, මත්තහස්තීන්ට; සීහො, සිංහරාජයෙකුවැනිවූ; ජිනගදිත, සර්වඥභාෂිතවූ; තිසික්ඛාරක්ඛනෙ, අධිශීලාදි ත්‍රිවිධශික්‍ෂාවන්ගේ සංරක්‍ෂණයෙහි; ආසත්තචිත්තො, ඇලුනාවූ සිත්ඇති; වනරතනමහාථෙරපාදෙ,වනරතනාභිධාන මහා ස්ථවිරපාදතෙම; විරාජෙ, බබලන්නේයි.

48 බුද්ධාරවින්දරුහධම්මමධුං සුසාධුං
සිස්සාලිපාලි සුතිපාණි පුටෙ නයන්තො
සබ්බත්‍ථ සන්තතපවත්තිතකිත්තිඝොසො
සො ධම්මකිත්ති කමහාථවිරො විභාති.

බුද්ධාරවින්දරුහ, සර්වඥනැමති පද්මයෙහි ජනිතවූ; සුසාධුං, අතිමධුරවූ; ධම්මමධුං, ධර්මාමෘතය; සිස්සාලිපාලි, ශිෂ්‍යනැමති මධුකරශ්‍රෙණින්ගේ; සුතිපාණි පුටෙ, ශ්‍රවණනැමති හස්තපුටයෙහි; නයන්තො, පමුනුවන්නාවූ; සබ්බත්‍ථ, හැමතැන්හි; සන්තත, නිරන්තරයෙන්; පවත්තිත, පවත්වනලද; කිත්තිඝොසො, කීර්තිඝොෂාඇති; සොධම්මකිත්තිකමහාථවිරො, ඒ ධර්මකීර්ති මහාස්ථවිරතෙමේද; විභාති, බබලන්නේයි.

49 සීලග්ගගන්ධවිතතො වතකෙසරොඝො
විතාපිඤාණවණ්ණගුණමූල ඵලාභිජාතො
කාරුඤ්ඤකණ්ණිකවරො කමලස්සභාවං
දස්සෙසි සාරගුවනෙකගුරුත්ථෙරො.

විතතො, පතළාවූ; සීල, චතුපාරිශුද්ධිශීලනැමති; අග්ගගන්ධ, උතුම්වූ සුවඳඇති; වතකෙසරොඝො, වුතනැමති කිංජල්ක

සමූහය ඇති; විපුලෙන, පතලාවූ; වණ්ණෙන, ප්‍රශංසාසහිතවූ; ගුණ, සීලාදිගුණනැමැති; මූලඵලාභිජාතො, මොළුම්ලයෙන් පව ගත්තාවූ; කාරුණ්‍යයෙ, දයානැමැති; කණ්ණිකාවරෙ, උතුම්වූ පුෂ්පකර්ණිකාවක් ඇති; සාර, හරවූ; භුවනෙක භූෂාරු පෙරෙහි, භුවනෙකබාහු මහාසාමිරතෙම; කමලසභාවං, පද්මස්වභාවය; දෙසෙසි, දක්වී.

50 අපරෙ'පි සුපෙසලා සුසික්ඛා
මුනිනො ආගමධාරණෙ සුදක්ඛා
සතතංව තපොධනෙ ගවෙසී
වනවාසිනො වසන්ති යස්මිං.

යස්මිං, යම් විහාරයෙක්හි; සුපෙසලා, සිල්වත්වූ; සුසික්ඛා, විශෙෂයෙන් හික්මුනාවූ; මුනිනො, සර්වඥයන්වහන්සේගේ; ආගමධාරණෙ, පර්‍ය්‍යාප්තිධර්මයෙහි; සුදක්ඛා, දක්‍ෂවූ; සතතංච, නිරන්තරයෙන්ම; තපොධනෙ, තපස්නැමැති ධනයන්; ගවෙසී, එසොයන්නාවූ; වනවාසිනො, අරණ්‍යවාසීවූ; අපරෙපි, අනිකුදු භික්‍ෂූහුද; වසන්ති, වාසයකෙරෙද්ද.

51 ඉච්චෙවං රම්මණෙය්‍යාතුලසිරිවිභවෙ සොපකාරෙ විහාරෙ
විජ්ජාකල්ලොලමාලිවිතතමධුරසා රතනසුඛසුභොජං
පඤ්ඤාමන්ථාවලම්බා පමථියගහණෙ චක්කපාණිසමානො
දීපෙනොනා සංගම්හං සිවපුරවට්ටුමං සංඝරාජා විරාජෙ.

ඉච්චෙවං, යථොක්තප්‍රකාරයෙන්; රම්මණෙය්‍ය, සිත්කළුවූ; අතුල, අසදෘශවූ; සිරිවිභවෙ, ශ්‍රීවිභූතිඇති; සොපකාරෙ, උපකාරසහිත වූ හෙවත් පූජ්‍යත්වඇති; විහාරෙ, ආරාමයෙහි; විජ්ජා, ත්‍රිශාකල්පවිකල්පාදි නොයෙක් ශාස්ත්‍රනැමැති; කල්ලොලමාලි, සමුද්‍රයෙහි; විතත, වැපිරනාවූ; මධුර, ප්‍රණීතවූ; සාරතත, සාරභාවනැමැති; සුඛ, පවිත්‍රවූ; සුභොජං, අමෘතය; පඤ්ඤාමන්ථාවලම්බා, ප්‍රඥානැමැති මෙරුපර්වතයෙන්; පමථිය, මථනයකොට; ගහණෙ, ග්‍රහණයෙහි; චක්කපාණිසමානො, විෂ්ණුයා සදෘශවූ; සිවපුරවට්ටුමං, නිර්වාණපුරමාර්ගය; සංගම්හං, යනිත්ව; දීපෙනොතා, ප්‍රකාශකරන්නාවූ; සංඝරජ්ජො, සංඝරාජොත්තමතෙම; විරාජෙ, බබලන්නේය.

52 සීලසමාධිකෙසා දුරසමාණවෙම්හා
සනතාපහාසිසම්ඛසතොහාරුසෙලො
දුරං කත්වා වාදිවාතා නකම්පො
දෙසෙසි ඉසා වාරු තොරුසභාවං.

සීලක්ඛන්ධ, රක්ෂිතභාවිත සීලස්කන්ධසංඛ්‍යාත; උදාර, මහත්වූ; සන්තාණවඩ්ඪනා, සජ්ජනාගාරයෙන්; සත්තාපහාසික්ඛන්ධ, සත්තාපහාසිස්කන්ධසංඛ්‍යාත; උරු, මහත්වූ; සන්තානසෙලොජ්ජලකුල පර්වතයන්; දූරංගතච්ච, දුරුගතාව; වාදිවාතා, කපිලකාණාද වාර්කාප නිගණ්ඨිකාදී වාදීන්ගේ ප්‍රත්‍යක්ෂාද්‍යනුමානොපමාන ප්‍රමාණාදිවාද සංඛ්‍යාත වාතයෙන්; නකම්පයා, කම්පා නොවූ; සො, ඒ සංසාරජ්ජනමු; චාරු, යහපත්වූ; හෙරුගෙස භාවං, මේරුපර්වතරාජයාගේ ස්වභාවය; දසෙසති, දැක්වී.

50 නිඛිලසුරනරසිරසි සුමසිතාසොභපංකජවිරාජිතො
විමලනිජගුණ සුරභිපභවන චාරුගන්ධකපඩකායෙජා
විපුලතරභව ජලධිපතාරණ හෙමසෙතුසරිසකො
සුගතාසුතාගති කුමුදමුදසසිසංසාරජවරො අහු.

නිඛිලසුරනර, සියලුදිව්‍යමනුෂ්‍යයන්ගේ; සිරසි, මස්තකයෙහි; සුමසිතා, පුදනලද; සොභපංකජ, මනොඥවූ පාදවයනින්; විරාජිතො, බබලන්නාවූ; විමල, නිර්මලවූ; නිජගුණ, ස්වකීය ශීලවූතාදී ගුණනැමති; සුරභිපභවන, සුගන්ධප්‍රභාවයට; චාරු, සුන්දරවූ; ගන්ධකපඩකායෙජා, සෞරභ්‍ය පද්මයක්බඳුවූ; විපුලතරභව, ඉතාමහත්වූ සංසාරනැමති; ජලධිපතාරණ, සමුද්‍රතාරණයට; හෙමසෙතුසරිසකො, ස්වර්ණමයසෙතුවලනායක් බඳුවූ; සුගතාසුතායති, සර්වඥපුත්‍රවූ යතීන්නැමති; කුමුදමුද, කොමුදප්‍රබොධයට; සසි, චන්ද්‍රයාබඳුවූ; සංසාරජවරො, සංසාරජ්ජනනාමයෙක්; අහු, වි.

51 ස දීපම්හිදීපෙන සුන්දරෙ තාම්බපණ්ණිරෙ
පාපන්ධකාරනිකරෙ නිරාසෙනො විරාජථ.

සො, ඒ සංසාරජ්ජනමු; දීප, දිලියෙන්නාවූ; මහිදීපෙන, ප්‍රදීපයෙන්; සුන්දරෙ, යහපත්වූ; තාම්බපණ්ණිරෙ, දෙහනිකනාතායෙහි; පාපන්ධකාරනිකරෙ, දෙසාන්ධකාර සමූහය; නිරාසෙනො, දුරුකරන්නෙන්; විරාජථ, බබලා.

52 තුපපාව සාසනම්බොජ තපිපාලනස්ස
කුමො පසහනව්නායන් ජලෙලාදයස්ස
දීපොපමෙ අසරණස්ස මහාජනස්ස
දීපො සපත්තනාම්හිං භතිධංසනස්ස.

සාසන, සර්වඥශාසනනැමති; මහාතපිපාලනස්ස, මහාගෞතාරණයට; කුමුදාකුව, කුසුමයක් බඳුවූ; පසනා, ප්‍රසන්

නුවූ; විගතජලොදයස්ස, විනාශවූ හැමිති සලිලප්‍රවාහයා ව; කූපො, උදපානයක්බඳුවූ හෙවත් ලිඳක්වැනිවූ; අසරණස්ස, ප්‍රශිටක්නැත්තාවූ; මහාජනස්ස, මහජනයාට; දීපොපමො, දිවයිනක් බඳුවූ, සපතා, සංඛ්‍යාතෙවෙශෙෂිකාදිවූ ප්‍රතිනියතවා දීන් හැමිති; තමසංගනී, අන්ධකාර ප්‍රබන්ධය; ධංසනස්ස, දුරුක රණයට; දීපො, ප්‍රභාකරයා බඳුවූ නොහොත් ප්‍රදීපයක්බඳුවූ.

56 සත්තාරවිඤ්ඤකාරමොදනාකරො
සංසොසතාරානිබ්බුතො නිසාකරො
විවාලිසඤ්ඤසරෝරුහාකරො
සම්භාසතෙ සඩසපනී දයාකරො.

සත්ත, සත්වහැමිති; අරවිඤ්ඤකාර, පද්මාකරයාගේ; මෝදන, විකාසයට; භාකරො, ප්‍රභාකරයාබඳුවූ; සංසොස, සංසසඬිහ හැමිති; තාරානිබ්බුතො, තාරකාවන් විසින් පිරිවරණලද; නි සාකරො, චන්ද්‍රයාවැනිවූ; විවාලිසඤ්ඤග, විටප්පනගැමිති හංග ශ්‍රෙණීන්ට, සරෝරුහාකරො, පියුම්විලක් බඳුවූ; දයාකරො, කරුණාවට ආකරවූ; සංසපනී, සංසරාජ්‍යතම; සම්භාසතෙ, බබලන්නේයි.

57 පුබ්බගොත්තතො දිතො ජනාන හදයෙතො
හාරිතතානමො සදා තපෙන පංකසොසතො
ලොකපොක්ඛරෙකතොව තොසතො සිරිධරො
සංසරාජපුඩගවො දිවාකරොව රජතෙ.

පුබ්බගොත්තතො, අභිනවපූර්වගොත්‍රයෙන්; උදිතො, පහළවූ නොහොත්; පුබ්බගොත්තතො, පූර්වපර්වතයෙන්; උදිතො, පහළවූ; ජනානං, සත්වයන්ට; අජ්ඣයතො, දේශවෙෂිකාවූ හිතාශීප්‍රදයකාවූ නොහොත්; ජනානං, සියළුසත්වයන්ට; අත්තාදෝසතො, නිවශීසම්පත්ත් ප්‍රදයකාවූ; හාරිත, දුරුකරණලද; තමො, මොහාන්ධකාර ඇති; නොහොත් හාරිත, දුරුකරණලද; තමො, අන්ධකාර ප්‍රබන්ධ ඇති; සදා, හැමකල්හි; තපෙන, තපසින්; පංකසොසතො, කාමපංකසොසනයකරන්නාවූ; නොහොත්; තපෙන, ප්‍රචණ්ඩාතපයෙන්; පඞ්කසොසතො, කර්දම ශුෂ්කකරන්නාවූ; ලොකපොක්ඛරෙ, සත්වනැමිති පුෂ්කරයන්; එකතොවව, ශුද්ධකාලයෙහි; තොසතො, ප්‍රබොධකරන්නාවූ නොහොත් විකාසයකරන්නාවූ; සිරිධරො, ඓශ්වර්‍ය්‍යසම්පත් දරන්නාවූනොහොත්; සිරිධරො, ප්‍රභාශ්‍රීදරන්නාවූ; සංසරාජ පුඩගවො, සංඝරාජෝත්තමතෙම; දිවාකරොව, දිවාකරයාමෙන්; රජතෙ, භාජිතවන්නේයි. *

* අභිනවගොත්‍රශීර්ෂාවා වල ගෙලශිලොවවයා-යනු නිසන්ඩුයි-

58 සබ්බාදෙසප්පහූතාගතබුධමධුපාසෙවනාධාරභූතෙ
සීලක්ඛන්ධස්සුගන්ධෙ සකුලසරසිජෙ සංසරජ්ජීරවිතෙ
පූරෙත්වා සුප්පතිට්ඨං ජිනවචනමධුං සංගහෙත්වා වසන්තො,
පුඤ්ඤාධාරෙ ගත්තෙ ස උපගතිසදා හංසපොතොපතිතො.

සබ්බාදෙස, සියලු දෙශාන්තරයෙන්; පහූතාගත, බොහෝව ආවාවූ; බුධමධුප, විද්වජ්ජනනැමති මධුකරීන්ගේ; ආසෙවන, නිරන්තර සේවනයට; ආධාරභූතෙ, පිහිටවූ; සීලක්ඛන්ධ, ශීලස්කන්ධනැමති; සුගන්ධෙ, මනොඥවූ ගන්ධඇති; සකුලසරසිජෙ, සවංශනැමති පද්මාකරයෙහි ජනිතවූ; සංසරජ්ජීරවිතෙ, සංසරජනැමති ශතපත්‍රයෙහි; පූරෙත්වා, පිරී; සුප්පතිට්ඨං, මොනවට පිහිටියාවූ; ජිනවචනමධුං, ජිනභාෂිත නැමති පුෂ්පරසය; සංගහෙත්වා, විශෙෂයෙන්ගෙණ; වසන්තො, වාසය කරන්නාවූ; පුඤ්ඤාධාරෙ, කුසලයට ආධාරවූ; ගත්තෙ, ගාත්‍රාභිධානවූ; සොඋපගති, ඒ උපතපස්වී නැමති; හංසපොතො, තරුණහංසතෙම; සදා, හැමකල්හි; පතිතො, ප්‍රසිද්ධවී.

59 උත්තුඞ්ගාවරණෙ පහාරිතරණෙ සම්භාසුරෙ තොරණෙ
ඛීරපොනිධිජාතචේත සදිසප්පාසාද පාසාදිකෙ
සුධාසිතවිසිතනවිගසූරභූපාලසඞ්ඛලීලාලයෙ
කලහාණ්ඨගන්ධියිකෙහි ලසිතෙ කලහාණිනාමෙපුරෙ.

උත්තුඞ්ග, අතිප්‍රාංශුවූ; ආවරණෙ, ප්‍රාකාරඇති; අපහාරිත, විශෙෂයෙන් දූරීකරණලද; රණෙ, ශත්‍රුකලහඇති; සම්භාසුරෙ, බබලන්නාවූ; තොරණෙ, බහිද්වාරඇති; ඛීරපොනිධි, ක්ෂීරසාගරයෙන්; ජාත, උපන්නාවූ හෙවත් නැගාවූ; චේතස දිස, බුබුළුරාශියක් බඳුවූ; පාසාදපාසාදිකෙ, ප්‍රසාදජනක ප්‍රාසාදයන්ඇති; සුධාසිත, සුධයෙහි භයනැත්තාවූ හෙවත් සංග්‍රාම ශූරවූ; විසිතනවභ, විනිෂණ්ණාභිධානවූ; සූරභූපාලසස, දිව්‍යරාජයාගේ; ලීලාලයෙ, ලීලාසථානවූ; කලහාණ, ශශපත්වූ; අග්ගික දිය්ගිකෙහි; ඇග්‍රගෙහොරා පරිඛාගෙන්; ලසිතෙ, බබලන්නාවූ; කලහාණිනාමෙපුරෙ, කලහාණිනම්පුරයෙහි.

60 නීලාපොතලජාතසෙත සතපත්තපාසාදිකංජාවලී
හංසීසඞ්දිවිගහවිතතපරිඛා ඛෙබා සුධාලිම්පගතා
පාකාරෙරූ පූරාභිධානව්ඛුසා සම්බා නිවිත්ථා සදා
කලහාණිනාමවිතතවිතතජලිතා වසතොවසන්ද්ධිසස්සතෙ

නීලාපොතල, නිල්ජලතලාවත්තෙහි; ජාත, හටගත්තාවූ; සෙතසතපත්තපාසාදි, සෙතාරවින්දනිකරාදිවූ; කංජාවලී, කුමුලයකොසාගාදෙන්දීවරාදිවූ ජලජපුෂ්පපඞ්ක්තියෙන්ගා; හංසීසඞ්දී,

රාජහංසසාරසකාදම්බාදිවූ; විහඟ, පලමරපක්ෂීන්ගෙන්; විචිත්ත, විසිතුරුවූ; පරිඛාබන්ධො, දියඅගලෙහි එකාබද්ධවූ; සුඛාලම්පිතො, සුඛසේපිරියම්කරණලද්දවූ; උරුපාකාරෙ, මහත්වූ ප්‍රාකාරයෙහිතොම; පුරාභිධානවධුයා, පුර නැමිති නානානාවවිසින්; සම්මා, මනාකොට; සදා, හැමකල්හි; නිච්චසො, ආවජ්ජාදනයකරණලද්දවූ; කලහංසනාදිත, මනොඥවූ අඩසනාගයක්ඇති ගෙවත් යහපත්විළුම්වක්ඇති; විචිත්තාවිතාත, විසිතුරුවූ චිත්‍රකර්මාන්තයෙන්; ජලිතො, බබලන්නාවූ; වෙළඹාඟුව, වස්ත්‍රයක් මෙන්; සංදිස්සතෙ, දක්නාලැබේ —— ආවජ්ජාදිත වස්ත්‍රයාගේ එක්විළුම්වක් පෙනෙනතැනකින් මෙහිද පුරනැමිති නාත්තාව විසින් අදනාලද මහාපව්රු නැමිති වස්ත්‍රයට දියඅගලවිත්‍ර විළුම්වක්කොට උපමාකළෝයි.

61 සාරඞ්ගමොරකකුටාදි විහඞ්ගමොහා
හාරීන්දනීලඡදනානි සරානි දිස්වා
නීලොරුමෙඝපටලානීති විසංකමානා
නිච්චං යහිං පුරවරෙ අභිනච්චයන්ති.

යහිංපුරවරෙ, යම්පුරප්‍රවරයෙක්හි; සාරඞ්ගමොරකකුටාදී, චාතක මයුරකපොතාදිවූ; විහඞ්ගමොහා, පක්ෂිසමූහයෝ; හාරී, මනොඥවූ; ඉන්දනීලඡදනානි, ඉන්ද්‍රනීලමය සෙවිලිඇති; සරානි දිස්වා, ගෘහයන් දැක; නීලොරුමෙඝපටලානීති, නිල්මහත් මෙඝකූටයෝයයි; විසංකමානා, සැකවන්නාහු; නිච්චං, සතතයෙන්; අභිනච්චයන්ති, නෘත්‍යයකෙරෙද්ද.

62 විපුලගොපුරගොපුර භාසුරෙ අම්බරමන්දිර සුන්දරමන්දිරෙ
පවරපණ්ඩිත මණ්ඩිත මණ්ඩපෙ පුරවරෙ විවිධා විබුධා අහූ.

විපුල, මහත්වූ; ගොපුර, දිව්‍යපුරයක් මෙන්; ගොපුර, වාහලින්; භාසුරෙ, බබලන්නාවූ; අම්බරමන්දිර, දිව්‍යවිමානයන් මෙන්; සුන්දරමන්දිරෙ, මනොඥවූගෘහඇති; පවර, උතුම්වූ; පණ්ඩිත, ප්‍රාඥයන්ගෙන්; මණ්ඩිත, හොබනාවූ; මණ්ඩපෙ, සභාමණ්ඩපම ඇති; පුරවරෙ, නගරවරයෙහි; විවිධා, අනෙකප්‍රකාරවූ; විබුධා, පණ්ඩිතයෝ; අහූ, වූ.

63 තුඞ්ගසිඛරෙසු මණ්ඩිතා මන්දවාතවලිතා ධජාවලි
නාගවාසපුප්ඵසිප්පනාගගෙ ගණ්හිතුං ගරුළාව උග්ගතා.

තුඞ්ග, උස්වූ; සිඛරෙසු, ශිඛරපඞ්ක්තීන්හි; මණ්ඩිතා, බඳනාලද්දවූ; මන්දවාතවලිතා, මන්දවූ සුළඟින් කම්පාකාරණලද්දවූ; ධජාවලි, ධජපෙළෙන්හු; නාගවාස, උරගාවාසයන්;

පුෂ්ප, මහත්වූ; යසිපත්තාගෙ, යෂ්ටි නැමති නාගයන්; ගණ්හිත්වාන, ග්‍රහණයකොට; උග්ගතා, අහසට නැගාවූ; ගරුළාඉව, ගරුඩයන් වැන්නාහුයි.

61 වරමන්දිරධූපිකනිග්ගතාභා මණියට්ඨිරංසී විසාලතරං
නගරම්බරමත්ථකපත්තසසී සිතජත්තමියං ජලතී'ව ඝනං.

වර, ප්‍රවරවූ; මන්දිර, ප්‍රාසාදයන්ගේ; ධූපික, කැරැල්ලෙන්; නිග්ගතාභා, නික්මුනාවූ රශ්මිකදම්බ නැමති; මණියට්ඨිරංසී, මාණික්‍යයෂ්ටිධරයෙහි; විසාලතරං, අතිවිසාලවූ; නගරම්බර මත්ථක, නගරාකාශ මස්තකයට; පත්ත, සම්ප්‍රාප්තවූ; සසී, චන්ද්‍රතෙම; ඝනං, ඒ සම්ප්‍රාප්තාකාශයෙහි; සිතජත්තමියං ඉව, ධවලච්ඡත්‍රයක්මෙන්; ජලති, දිලිසෙන්නේයි.

65 යස්මිං සදා භාසුරතෝරණෙසු අබ්භරම්භාකධජාවලීනං
ඡායාසු බිම්බෙසු නිසීදයන්ති බාලා තපාපජ්ජිත වජ්ජිතෙසු.

යස්මිං, යම්පුරයෙක්හි; සදා, හැමකල්හි; භාසුරෙ, බබලන්නාවූ; තෝරණෙසු, තෝරණයන්හි; අබ්භ, ඔසවනාලද්දවූ; රම්භාකධජාවලීනං, කදලි වෘක්ෂධ්වජමාලාවන්ගෙන්; ආතපාපජ්ජිතවජ්ජිතෙසු, ආතපවෘත්තිය දුරුකළාවූ හෙවත් අව්ව යම් නැත්තාවූ; ඡායාසුබිම්බෙසු, නොයෙක් ඡායා මණ්ඩලවල්හි; බාලා, බාලදූරකයෝ; නිසීදයන්ති, ක්‍රීඩාකෙරෙද්ද.

66 චතුගෝපුරවාර දිසාවාසවාසා
තිරච්ජානජාතෙන ලොකෙ පතීතා
ඵනවිඤ්ඤු තුංගෙ ඨපෙත්වා පයාපං
පිවන්තා කුමාරවහසිඝා ජලන්ති.

චතුගෝපුරවාර, සිව්ගොපුරයකින් ඇවිදිනාවූ; දිසාවාසවාසා, දිසානැමති වස්ත්‍රයන් අවජාදනය කරන්නාවූ; තිරච්ජානජාතෙන, තිරිසන්සූයයි යනනම්න්; ලොකෙපතීතා, ලොකප්‍රසිද්ධවූ; ඵනවිඤ්ඤු, පයොධරයුග්මයෙහි තුංගෙඨපෙත්වා, මුවතබාගෙණ; පයාපංපිවන්තා, ක්ෂීරපානය කරන්නාවූ; කුමාරවහසිඝා, කුමාරනම්වූ සිංහපොතකයෝ; ජලන්ති, දිලිසෙද්ද.

අභිනවපදශ්ලොකයයි.

67 සස්සිරිකවරරාජධානිං සාරභෙදුකනිකීළහෙරතා
කාසකාස වනිතා විරාජිතා අච්ඡරා'ච 'තිබ්බෙසෙහි තංඝණෙ.

සස්සිරික, ශ්‍රීසම්පන්නවූ; වර, උදාරවූ; රාජධානියං, ඒ කලාණි පුරයෙහි; සාරභෙදුකනිකීළනෙ, සාරභෙදුකනිකීළනෙ, සාරගෙඩුකක්‍රීඩා

යෙහි; රතා, ඇළුණාවූ; වනිතා, කාන්තාවෝ; තත්තත්, ඒ ඒ තන්හි; අභිමිංසහි, අනිමිෂාක්ෂීන් කරණකොටගෙණ; තං ඛණං, ඒ ක්‍රීඩාක්‍ෂණයෙහි; අච්ඡරාඉව, දිව්‍යාප්සරාවන්මෙන්; විරාජිතා, ශොභියාහුයි.

68 සදා විපිනං සුගතානං ගජිනං
කපොලතලෙ දනතො බඩපාද
අනෙකාලිපාලි සුරිඳස්ස කිතතිං
සඣුංකාරරවෙන සංගායිතාංව.

සදා, හැමකල්හි; විපිනං, පුරවිපිනයෙහි; සුගතානං, සගපත් වූ ගමන්ඇති; ගජිනං, හස්තීන්ගේ; කපොලතලෙ, ගණ්ඩ ස්ථලයෙහි; දනතො, මදජලයෙන්; බඩපාද, බඳනාලද පාද ඇති; අනෙකාලිපාලි, නොයෙක්භෘංගාවලිහු; සුරිඳස්ස, ඒ විගිෂණදිව්‍යරාජයාගේ; කිතතිං, කීර්තිය; සඣුංකාරරවෙ න, ඣුංකාරසඞ්ඛ්‍යාතනාදයෙන්; සංගායිතාඉව, ගායනාකරන්න වූන්මෙනි.

69 සුවිපුලතරතුගා චම්මතො භූසිතඟා
ජලධුදිතතරඟා වෙරිචකානි හගා
දිවසකරතුරගා වෙගජිතාතාරඟා
රුචිරතරතුරගා රංජයනෙත අසගා.

සුවිපුලතර, ඉතාමහත්වූ; තුගා, එසෙසින්මඋස්වූ; චම්මතො, සහනාගයෙන්; භූසිතඟා, සන්නද්ධවූ දෙහඇති; ජලධි, සමුද්‍රයෙන්; උදිත, නැගාවූ; තරඟා, රළපහරබඳුවූ; වෙරිච කකානි, ශත්‍රුසෙනාව; හගා, මර්දනයකරන්නාවූ; දිවසකර තුරගා, සූර්‍ය්‍යාශ්වයන්ගේ; වෙග, ජවයට; නිකූතාරගා, අප හාසකරන්නාවූ ජව ගතිඇති; අසගා, අස්ඛලිතවූ; රුචිර, ඉ තාමනොඥවූ; තුරගා, අශ්වයො, රංජයනෙත, සිත්ඇලවද්ද.

70 පවනසම්භිධූතා විපිනං විසු පසෙස
ධජනිකර තරගා නාවෙකාදුරමච්ඡා
සුරසරපමුඛමිගා නිගාතා වාරුරවජා
මහමහිමගිරිමිගා පාතුභූතා නංදීව.

විපිනං, පුරවිපිනයෙහි; විසුපසෙස, උභයපාර්ශ්වයෙහි; පවන සම්භිධූතා, පවනයින්කම්පාකරණලද්දවූ; ධජනිකරතරගා, ධජ සමූහනැමති රළඇති; නාවෙකාදුරමච්ඡා, ජටවන්නැමති මහත් මත්ස්‍යයන්ඇති; සුරසරපමුඛමිගා, දෙවමන්දිරාභිමුඛ යෙන්; නිගගතා, නික්මුනාවූ; වාරු, මනොඥවූ; රවජා, වට තොම; මහිම, ආශ්චර්‍යවූ; හිමගිරිමිගා, හිමාලපර්වතයෙන් පාතුභූතා, පහළවූ; නදීඉව, ගඟාහම් ගඟ වැන්නීයි.

71 නෙකාසාගතවෙසියානනයනෙ සම්පිනයන්තාපණා
නානාධූපතනසිලිමුඛාවලිවිසාලාපානවාසූපමා
චිවාකවනගංසවාපිසදිසා සා රාජධානී සදා
තොසාපෙති පුරබ්බාසිහදයෙ චින්තාමණී වුත්තමා.

නෙකාසාගත, නොයෙක් දිගින්ඇවාවූ; වෙසියාන, වණිග්ජනයාගේ; නයනෙ, නෙත්‍රයන්; සම්පිනයන්තා, සතුටුකරවන්නාවූ; ආපනා, සල්පිල්ඇති; නානාධූපතනසිලිමුඛාවලි, නොයෙක් සලලාලනැමතිභෘඞ්ගශ්‍රේණීන්ට; විසාල, මහත්වූ; ආපානවාසූපමා, පානමන්දිරයක් උපමාකොටඇති; චිවා, ජඩිතජන නැමති; කවනගංස, සවණීහංසයන්ට; වාපිසදිසා, තටාකයක් බඳුවූ; සාරාජධානී, ඒ කලාණීනම් පුරිතොම; උත්තමා, උතුම්වූ; චින්තාමණීඉව, අභිප්‍රායසිද්ධයකාවූ චින්තාමාණික්‍ය යකබඳුව; පුරබ්බාසිහදයෙ, පුරවාසීන්ගේ චිත්තයන්; සදා, හැමකල්හි; තොසාපෙති, සතුටුකරවන්නීය.

72 පයොසමුද්දදිතඵේනසන්නිභෙ
විරොචමානෙ පටිමාඝරෙ ඝරෙ
විචිත්තචිත්තා පටිමා මනොරමා
සජීවබුද්ධා විය භන්ති සබ්බදා.

පයොසමුද්ද, ක්ෂීරසාගරයෙන්; උදිත, නැගුනාවූ; ඵේනසන්නිභෙ, බුද්බුදරාසියක්මෙන්; විරොචමානෙ, බබලන්නාවූ; පටිමාඝරෙඝරෙ, ප්‍රතිමාලයක් ප්‍රතිමාලයක්පාසා; විචිත්ත, අතිදර්ශනීයවූ; චිත්තා, චිත්‍රකර්මයෙනැති; මනොරමා, මනොඥවූ (උත්තමදර්ශනයෙන් සලකුණුවූ); පටිමා, ප්‍රතිමාවෝ; සජීවබුද්ධාවිය, දෘශ්‍යමාන සර්වඥවරයන්මෙන්; සබ්බදා, නිරන්තරයෙන්; භන්ති, බබලන්නාහුය.

73 පදෙ පදෙ සජ්ජිතපුප්ඵහාරා කරෙ කරෙ ධාරිතදීපමාලා
භුජෙ භුජෙ ලම්බිතපුප්ඵපෙළා මුඛෙ මුඛෙ වත්තිතසාධුකාරා.

පදෙපදෙ, පියවරක් පියවරක්පාසා; සජ්ජිත, රැස්කරණලද; පුප්ඵහාරා, කුසුමරාසීන්ඇති; කරෙකරෙ, හස්තයක්හස්තයක්පාසා; ධාරිත, දරණලද; දීපමාලා, ප්‍රදීපපංක්තිහැඇති නොහොත් ප්‍රදීපපුෂ්පයන්ඇති; භුජෙභුජෙ, බාහුවක් බාහුවක්පාසා; ලම්බිත, එල්ලෙන; පුප්ඵපෙළා, මල්පෙට්ටිඇති; මුඛෙමුඛෙ, මුඛයක් මුඛයක්පාසා; වත්තිත, පවත්වනලද; සාධුකාරා, සාධුකාරශබ්දඇති.

74 කරඤ්ජලී සණ්ඨපිතා සිරෙ සිරෙ
සුපණ්ඩරා සාරණතා මිහෙමනෙ
නිරන්තරං සාධුජනා දිනෙදිනෙ
නමස්සයන්තා පටිමාඝරෙඝරෙ.

සිඛරසිඛර, මස්තකයක් මස්තකයක්පාසා; සණ්ඨිතා, පිහිටුවනලද; කරජලී, හස්තපුටයන්ඇති; මගෙමගෙ, විතානයක් විතානයක්පාසා; හිරණ්ණතාරං, අම්බරතලයෙන්; කාරණකා, සිඝ්‍රකරන්නාවූ; සුපත්තිකා, යහපත් ප්‍රාණීන්ඇති; සාධුජනා, සත්පුරුෂජනයෝ; දිනෙදිනෙ, දවසක් දවසක්පාසා; පච්චාසන්නසරෙ, ප්‍රතිබිම්බගෘහයක් ප්‍රතිබිම්බගෘහයක්පාසා; නමස්සයන්තා, නමස්කාර කරන්නෝවෙත්.

75 රජපත්තවනිතා 'චිරප්පභා දුන්දුභිස්සරපයොධරස්සරා
ඉන්දනීලමණිවාසසාරදා ගෙහමොරනිකරං පමොදයුං.

රජපත්ත, නෘපමණ්ඩලප්‍රාප්තවූ; වනිතා, නාටකස්ත්‍රීන්නැමති; අචිරප්පභා, විද්‍යුල්ලතා ඇති; දුන්දුභිස්සර, අතොද්‍යශබ්දලධ්වනිනැමති; පයොධරස්සරා, මේඝගජ්ජනාඇති; ඉන්දනීලමණිවාස, ඉන්ද්‍රනීලමාණික්‍යප්‍රාසාදනැමති; සාරදා, මේඝසමූහයෝ; ගෙහමොරනිකරං, ගෘහමයූරසමූහය; පමොදයුං, සතුටුකරවූවාහුයි.

76 තත්‍ථ 'ගාරගෙ අභිනවච්ඡමෙ අදසඤ්ඤිබ්බෙ පටිබිම්බරූපා ආගම්ම නාකා උපපත්තිභූතා ලුත්වා නටනායා සුරනාටිකාඉව.

තත්‍ථ, ඒ පුරයෙහි; අගාරගෙ, උතුම්වූනෘපමණ්ඩලයෙහි; අභිනවච්ඡමෙ, නළුවන්නෘත්‍යයකරණකල්හි; අදසඤ්ඤිබ්බෙ, දර්පණස්තම්භයෙහි; පටිබිම්බරූපා, ප්‍රතිබිම්බරූපයෝ (කුමක්මෙන්ද); නාකා, දිව්‍යලොකයෙන්; අගම්ම, අවුත්; උපපත්තිභූතා ලුත්වා, ඔවුන්ට ප්‍රතිපක්ෂව; නටනායා, නෘත්‍යයකරන්නාවූ; සුරනාටිකාඉව, දිව්‍යනාටිකාවන් වැන්නාහුයි.

77 තමෙව රූල්ඛිතා නාලිකෙර උදුන
සද මන්දවාතෙන සංකම්පමානා
මුණිකුලෙයෙ දස්සනරියා පට්ටා
නමස්සියා සීසසි පොණෙරගාව.

තමෙව, නදීකූලයෙහි; රූල්ඛිතා, පනිකාවූ; සද, නැමිකල්හි; මන්දවාතෙන, මන්දනිලයෙන්; සංකම්පමානා, කම්පාකරණල ඔන්නාවූ; උදුන, බොහෝවූ; නාලිකෙරා, නාලිකෙරවෘක්ෂයෝ; මුණිකුලෙයෙ, ප්‍රතිමාගෘහයන්; දස්සනරියා, දක්නාපිණිස; පට්ටා, පැමිණ; නමස්සියා, නමස්කාර කරණපිණිස; සීසෙසි, මස්තකය කරණකොටගෙණ; පොණ, ප්‍රවණවූ; උරගාඉව, දිව්‍යනාගයන් වැන්නාහුයි.

78 වරලයාදී පටිබිම්බරූපා යස්මිං වගන්ති මගති සවන්ති
පුරගතාවතතාවිලොකනාය පහුතා'මාදාසතලං'ව භාති.

යස්මිං, යම්පුරයෙක්හි; වරලයාදී, උතුම්වූ ප්‍රතිමාලයාදිවූ; පටිබිම්බරූපා, ප්‍රතිබිම්බරූප ඇති; මහති, මහත්වූ; වගන්ති, ජල ප්‍රවාහය ඇති; සවන්ති, නදී තොම; පුරගතා, පුර නැමති කාන්තාවගේ; වතතාවිලොකනාය, මුඛදර්ශනය පිණිස; පහුතා, පහළවූ; අදාසතලංඉව, දර්පණතලයක් මෙන්; භාති, බබලන්නීද.

79 තටිසු සංකිණ්ණ විහගනාද නිරන්තරං සිනද්ධ විසදම්බුනා
සම්භානකුවාවලවල්ලභෙන පුරගනාපෙසිතමෙඛලා'ව.

තටිසු, උභයතීරයෙහි; සංකිණ්ණ, ගැවසීගත්තාවූ; විහගනාද, පක්ෂීන්ගේ රාවපළිරාව නාද ඇති; නිරන්තරං, හැමකල්හි; විසදම්බුනා, වගනායවත්නාවූ; සිනද්ධ, ගඟාතොම; සම්භාන කුවාවල, සම්භාන කූවපර්වත නැමති; වල්ලභෙන, ස්වාමිහුවිසින්; පුරගනා, (කලත්‍රණී) පුර නැමති කාන්තාවට; පෙසිත, එලවනලද්දාවූ; මෙඛලා'ඉව, මෙවුල්දමක් වැන්නීය.

80 දෙවාපගා සලිලකීළනදෙවලොකං
භාරපිතා විය අයං සරිතා පතිතා
වෙලනතවිතතසිතවත්ථ නිවත්ථකෙන
සොවණ්ණභාරු වරමොලිවිභූසිතෙන:

81 සද්දස්සනීයරතනාකරභූභුජෙන
කල්ලොලමාලිනදපිවරභාසිතෙන
ධානනාතිදං සුගතරාජපදංධපෙතුං
චත්වා පසාරිතකරං'ව තද විභාති.

දෙවාපගා, ආකාශගඟාවෙහි; සලිලකීළන, ජලක්‍රීඩාකරන්නාවූ; දෙවලොකං, දෙවියන්ගේ ලොකය; භාරපිතාවිය, තමා කරා පමුනුවන්නියක මෙන්; පතිතා, ප්‍රසිද්ධවූ; අයංසරිතා, මේ නදී තොම; වෙලනත, කුලාතත නැමති; විතත, විසිතුරුවූ; සිත, ධවලවූ; වත්ථනිවත්ථකෙන, වස්ත්‍රාච්ඡාදනයක් ඇත්තාවූ; සොවණ්ණභාරු, ස්වර්ණමෙරුපර්වත නැමති; වර, උතුම්වූ; මොලිවිභූසිතෙන, කිරීටාභරණයෙන් සැරහුනාවූ.

සද්දස්සනීය, දැකුම්කලුවූ; රතනාකර භූභුජෙන, රත්නාකර නැමති මහරජහු විසින් හෙවත් සමුද්‍රරාජයා විසින්; කල්ලොලමාලිනද, සමුද්‍ර ඝොෂා නැමති; පිවරභාසිතෙන, අ[illegible]ත වචනයෙන් හෙවත් ප්‍රියභාෂණයෙන්; සුගතරාජපදං, සර්වඥ

පාදය; ඨපෙතුං, පිහිටුවන්ට නොහොත්; සුගතරජ, සර්වඥරාජොත්තමයානන්වහන්ස; පදංඨපෙතුං, ඔබගේ ශ්‍රීපාද ප්‍රතිෂ්ඨාවට; ඉදංඨානංඉති, මේ ස්ථානයයි; වත්වා, කියා; තද, එකල්හි; පසාරිතාකාරංඉව, දිගුකරණලද හස්තයක්මෙන්; විභාති, බබලන්නියි.

82 යස්මිං වහන්ති මහතී සවන්තී පදප්පතිට්ඨාය සම්භතකූටං
පයාතනාථස්ස සුරාධිපෙන මගොත්ථතොදාතපටාවලීව.

යස්මිං, යම්පුරයෙක්හි; වහන්ති, ස්‍යන්දනයවන්නාවූ; මහතී, මහත්වූ; සවන්ති, ගඞ්ගාතොම්; පදප්පතිට්ඨාය, ශ්‍රීපාදප්‍රතිෂ්ඨාවපිණිස; සම්භතකූටං, සම්භතකූටපර්වතයට; පයාත, එබනාවූ; නාථස්ස, සර්වඥයහට; සුරාධිපෙන, විශිෂ්ණදිව්‍යරාජයාවිසින්; මගො, මාර්ගයෙහි; අත්ථත, අතුරණලද; ඔදාත, ශුභ්‍රවූ; පටාවලි ඉව, පටාවලියක් හෙවත් පියවිලියක්වැන්නිද.

83 සම්බුද්ධපාදම්බරංසිහිරෝධරස්ස
නීහාරහාසම්හලිම්පිතැව්ගහස්ස
ලුද්දලගද්දහරණස්ස සම්භතකූට
සූලිස්ස මත්ථකපභූතසුරාපගාව.

සම්බුද්ධපාද, සර්වඥශ්‍රීපාදලාංඡනනැමැති; අම්බරංසි, වස්ත්‍රයා; සිරෝධරස්ස, මස්තකයෙන් දරුවාවූ; නීහාර, තුෂාර නැමැති; හාසම්හලිම්පිත, ජාරිකා ගල්වනලද; විගාහස්ස, දෙකඇත්තාවූ; ලුද්ද, ව්‍යාධ නැමැති; අලගද්ද හරණස්ස, සර්පාභරණ ඇත්තාවූ; සම්භතකූට, සම්භතකූට පර්වත නැමැති; සූලිස්ස, මහදෙව්යාගේ; මත්ථක, ජටාවෙන්; පභූත, පහළවූ; සුරාපගා ඉව, ආකාශගඞ්ගාවක් වැන්නීයි.

84 කාලෙල්ලාලමාලිසවලි නිම්මලි සරිතා අසං
පතීරවයවිතානිතා වාලුකාදනාධාරිනා

85 නීහාරබින්දුදනෙන සම්භතගිරිදන්තිනා
හත්ථිහත්ථං වරාජෙති සිනබුවාපි පසාරිතං.

කාලෙල්ලාලමාලී, තරඟමාලා නැමැති; සවලි, රැළිසහිතවූ; නිම්මලි, ප්‍රසන්නවූ; අසංසරිතා, මේගඞ්ගාතොමෝ; පතීරවය, උභයතීරයෙහි; විතානිතා, පතළාවූ; වාලුකා, පුලිනතල නැමැති; අනාධාරිනා, අලසගලස්දරන්නාවූ.

නීහාරබින්දු, තුෂාරබින්දු නැමැති; දානන, මදජලයඇත්තාවූ; සම්භතගිරිදන්තිනා, සම්භතකූටනැමැති හස්තියාවිසින්; සින්ධුවාපි, සමුද්‍ර නැමැති තටාකයට; පසාරිතං, දිගුකරණලද; හත්ථිහත්ථං ඉව, හස්තිශුණ්ඩාකාරයෙන්; රාජෙති, බබලන්නේයි.

86 තාරගම්ාලි එනගඩිභූපෙතා තාරකාසොචජ්ජිතාභූසිතාගා
ගඞා අයං චාරුසම්භතාකුව චම්පිකාතො යාතාසුරොරගො'ව

තාරගම්ාලි, සමුද්‍රහැමිති; එනගඩිභූපෙතා, පෙනගැඩින්සුක්තවූ; තාරක, ජලහැමිති; සොචජ්ජිත, සොවැතිගෙන්; භූසිතාගා, සැරසුනාවූ දෙහඇති; චාරු, මනොඥවූ; අයංගඟා, මේනදීතොම; සම්භාතාකුව, සම්භාතකුවහැමිති; චම්පිකාතො, තුඹසින්; යාත, ගියාවූ; සුරොරගොඝුව, දිව්‍යනාගයෙකු වැන්නීයි.

87 යස්මිං පුරෙ ජලිතනිම්මලදීපමාලා
දෙවාධිපො සසිගුණා'පි මහාගුණො'ති
මන්ත්වාන තං නිම්කරං පරිතො පහාය
අගම්ම දෙවපතිමාවුතතාරකා'ච.

යස්මිංපුරෙ, යම්පුරයෙකහි; ජලිත, ප්‍රජ්වලිතවූ; නිම්මල, ප්‍රසන්නවූ; දීපමාලා, ප්‍රදීපශ්‍රෙණිහු; දෙවාධිපො, සුරාධීශ්වර තෙම; සසිගුණාපි, චන්ද්‍රයාගේගුණයටදවඩා; මහාගුණොති, අධිකවූ ගුණඇත්තේයයි; මන්ත්වාන, දැන; තංනිම්කරං, ඒ චන්ද්‍රයා; පරිතොපහාය, හාත්පසින්හැර; අගම්ම, අවුත්; දෙවපතිමාවුත, දිව්‍යප්‍රතිමාව වටකළාවූ; තාරකාශ්ච, තාරකාවන් වැන්නෝද.

88 යහිං රජ්ජන්තො බහුදීපමාලා
සුරාචාරිනා දෙවරාජඩ්භූතාගෙගා
ගුණෙණසෙ වරාවෙහි ලක්ඛිංඨපෙතුං
අප්පුතතානි වෙ ලොහිතංගො ගගෙභවා.

89 පභාතාය පඩාය සායණ්හකාලං
ගණ්හෙවාන වණ්ණසු අනතං අදිස්වා
කුසිතො'ච ලුතිවා සමනතා තිරනතා
සද ජාතිරගා'ච සම්භාසයන්ති.

යහිං, යම්පුරයෙක්හි; රජ්ජමානා, විරාජමානවන්නාවූ; බහු, බොහෝවූ; දීපමාලා, ප්‍රදීපමාලාවෝ; සුරාචාරිනා, දෙවගුරුවූ බ්‍රහස්පතිප්‍රවීණින්; දෙවරාජඩ්භූතාගගා, විශිෂ්ඨදිව්‍යරාජයාගේ අණවැසිවූ උදක්වූ; ගුණෙණෙහ, ගුණසින්; වරාවෙහි, සිප්පින් කරණ්කොට්ගෙණ; ලක්ඛිංඨපෙතුං, ලක්තබන්ට; වෙ, ඒකාන්තයෙන්, අප්පුතානංගෙ, අසුද්ධසුසයි; ලොහිතංගො ගගෙභවා, පද්මරාගරත්නයන්ගෙණ.

පභාතායපඩාය, උදයකාලයෙහිපටන්; සායණ්හකාලං, සන්ධ්‍යාකාලය දක්වා; ගණ්හවාන, ඒකසප්තාහදිවසයෙන් ලත්

තබාගැණ; වණ්ණෙනස්සු, ඒ දිව්‍යරජ්ජස්සගුණයෙහි; අනන්තං අදිස්වා, කෙළවරනොදැක; කුසිතොපුබ්බාභූව, කොසදැයට පැමිණෙනසෙයින්; සමන්තා, හාත්පසින්; අකිරන්තා, විසුරුවන ලද්දවූ; ජාතිරඟාභූව, ලොහිතංක මාණික්‍යයන්මෙන්; සඳ ගැම්කල්හි; සම්භාසයන්ති, විශේෂයෙන් බබලද්ද.

90 සවන්තා ඔගහන්තා සවන්තිජලස්මිං
අධො දීඝස්සමානා විලොලා පදීපා
යහිං මානනත්ථාය නාගාධිවාසා
භුජඟාභතා ජාතිරංගා'ව භන්ති.

යහිං, යම්පුරයෙක්හි; සවන්තා, වහනයවින්නාවූ; ඔගහන්තා, ඔගන්නාවූ; සවන්ති, නදීයාගේ; ජලස්මිං, උදකසයෙහි; අධො, යට; දීඝස්සමානා, දික්හාලබන්නාවූ; විලොලා, චචලවූ; පදීපා, ප්‍රදීපයෝ; මානනත්ථාය, පුදනපිණිස; නාගාධිවාසා, නාගලොවින්; භුජඟාභතා, නාගින්විසින් ගෙණඑනලද්දවූ; ජාතිරංගාභූව, දැරගම්ණිරැසියක්මෙන්; භන්ති, දිලිසෙද්ද.

91 සම්පත්තිසම්පන්නජනාභිරම්මා
පාසාදපාසාදිකරාජධානි
සමන්තතො භොගභරෙණ භූමිං
පත්තොතං'ව සග්ගස්ස මසක්කසාරං.

සම්පත්තිසම්පන්නා, උපභොග පරිභොග සම්පත්තීයෙන් සමෘද්ධවූ; ජනාභිරම්මා, සත්ත්වයන්ගේසිත් ඇලවන්නාවූ; පාසාදිකා ප්‍රසාදවනාවූ; පාසාද, විභූම්කාත්‍රිභූමිකාදිවූ ප්‍රාසාදඇති; රාජධා නි, ඒ කල්‍යාණිපුරිතොම, සමන්තතො, හාත්පසින්; භොග භරෙණ, (දිව්‍ය)සම්පත්තිභාරයෙන්; සග්ගස්ස, ශක්‍රයාගේ; මසක්කසාරං, මසක්කසාරනම්වූ අමරාවතීපුරියතොම; භූමිං පත්තාංඉව, භූමිප්‍රාප්තවූවාක් වැන්නීයි.

92 භූකිත්තිසිරිමෙඝවණ්ණජගතීපාලෙන යා කාරිතා
සා කිත්තිසිරිමෙඝවණ්ණවිදිතා කල්‍යාණිනාමා පුරී
පුබ්බෙවණ්ණිතරාජධානිසදිසා සාත්තියා සිද්ධිම
අප්පෙත්වා විය ලංකාභාර ගහිතං සංපිණ්ඩිතං ලංකිතං.

යා, යම්පුරයක්තොම; භූ, පෘථිවියෙහි; කිත්තිසිරිමෙඝව ණ්ණ, කීර්තිශ්‍රීමෙඝවර්ණනම්; ජගතිපාලෙන, පෘථිවිපාලයාවි සින්; කාරිතා, කරවනලද්දී; කිත්තිසිරිමෙඝවණ්ණවිදිතා, කීර්තිශ්‍රීමෙඝවර්ණයයි ප්‍රසිද්ධවූවාද; පුබ්බෙවණ්ණිතා, පූර්වයෙහි වර්ණිතවූ; රාජධානිසදිසා, රාජධානියකා සදෘශවූ; කල්‍යාණ

Positive
Negative 1
Reel No. 13 / 095
Date: 8/1/92



ණිනාමාපුරී, එකාලඞ්කාරණි නම්පුරීහොව; නානාවිධයා, නොයෙක් සම්බාධයෙන්; ඝිදිසි, කොබඳුවන්නීද; ලංජනෙන, විග්ණ විගශ ඝයකින්; අපෙත්වා, අර්පිතකොට හෙවත් පිහිටුවා; ගහිතං, ගන්නාලද; ලංජනංවිය, ලාංඡනයක්මෙන්; සන්දිස්සතෙ; දක් නාලැබේ.

93 එවං විධෙ බහුවිධිස්සරියස්ස වාසෙ
ලඞ්කඞ්ගනාතිලකභූත පුරුත්තමස්මිං
නිස්සෙසසත්තසිරිදෙ සුරපාදපොව
යො සො විරාජති විභීසනදෙවරාජා.

එවංවිධෙ, මෙබඳුවූ; බහුවිධ, අනෙකප්‍රකාරවූ; ඉස්සරියස්ස, ඓශ්වර්‍ය්‍යයට; වාසෙ, වාසස්ථානවූ; ලඞ්කඞ්ගනා, ලඞ්කා නැමැති කාන්තාවට; තිලකභූත, තිලකයක් බඳුවූ; පුරුත්තමස්මිං, උතුම්පුරයෙහි; නිස්සෙසසත්ත, සියලුසත්වයන්ට; සිරිදෙ, ඓශ්වර්‍ය්‍යදායකවූ; සුරපාදපොව, කල්පවෘක්ෂයක්මෙන්; යො සො විභීසනදෙවරාජා, යම් ඒ විභීෂණනම් දිව්‍යරාජයෙක්; විරාජති, බබලන්නේද.

94 ආදෙවරාජපුර 'මාඵණිරාජ ලොකං
අචක්කවාලසිඛරි විනිවිජ්ඣවත්ති
කිත්තිප්පබන්ධවිභවා 'ඛිලලොකගබ්භං
ඛීරණ්ණවෙ'ක සදිසං සතතං අකාසි.

ආදෙවරාජපුරං, දිව්‍යලොකයදක්වාද; ආඵණිරාජලොකං, නාගලෝකයදක්වාද; අචක්කවාලසිඛරි, චක්‍රවාලපර්වතයදක්වාද; විනිවිජ්ඣවත්ති, විනිවිදපවත්නාවූ; කිත්තිප්පබන්ධවිභවා, යශස්ප්‍රබන්ධ සම්පත්තීහුගෙන්; අඛිලලොකගබ්භං, සියලුලෝකගර්භය; සතතං, නිරන්තරයෙන්; ඛීරණ්ණව, ක්ෂීරාර්ණවයගා; එකාසදිසංඅකාසි, එක්කොට සදෘශකළාද.

95 දෙවින්දු පත්වා කිත්තිතෙජෙහ'ගතාදිසංතරං
ගන්ත්වා පරෙ විජිත්වාන පුනා ගන්ත්වාන 'සන්තිකං
96 සාරගාරවලිවාරු කිරීටමණිලෙසතො
තාව දෙහං 'වපත්වාන අලිඞ්ගිත්වාන භාසරෙ.

දෙවින්දු, දිව්‍යරාජොත්තමවූ; පත්වා, පතලාවූ; කිත්තිතෙජ, කීර්තිය හා තේජස; අගතාදිසන්තරං, අප්‍රාප්තවූ ඌර්ධ්වා ධොප්‍රාච්‍යදක්ෂිණාදි දිගාන්තරයට; ගන්ත්වා, ගමනයකොට; පරෙවිජිත්වාන, ශත්‍රූන්ජයගෙණ; පුන, නැවත; සන්තිකං, සමීපයට; අගන්ත්වාන, පැමිණ,

සාර, මහාසිඳු; හාරවලි, මුක්තාහාරව්‍යාජයෙන්; වාරු, මනො ඥවූ; කීර්තිමමතිලෙසතො, ක්‍ෂීරරත්නව්‍යාජයෙන්ද; තවදෙහං එව, ඔබගේ ශ්‍රීමූර්තියමම්; පත්වාන, පැමිණ; අලිඞ්ගිත්වාන, ආශ්ලෙෂකොට; භාසරෙ, බබලන්නාහුද.

97 ජනානුවත්තනසාගරන්තා මෙත්තාසින්ධුභාසුරෙ
වෙරීනාගජෙය්‍යතෙජ සීහපුඞ්ගවාලයො
වන්දිවුත්තිවායුවෙගසංකුලි යසො හිමෙ
දෙවරාජ නිබ්බලී හිමාවලො විරාජතෙ

ජනානුවත්තන, සත්වයන්ගේ සිත්නැමති; සාගරන්ත, සමුද්‍රය අවසංකොට පවත්නාවූ; මෙත්තාසින්ධු, මෛත්‍රීනැමතිගඟාවෙන්; භාසුරෙ, භ්‍රාජිතවන්නාවූ; වෙරීනාගජෙය්‍ය, ශත්‍රූන් නැමති ගජයින් ජයගන්නාවූ; තෙජ, තෙජස්නැමති; සීහපුඞ්ගව, සිංහරාජප්‍රවරයන්ට; ආලයො, වාසස්ථානවූ; වන්දිවුත්ති, වන්දිජනයාගේ ගද්‍ය පද්‍යගීතප්‍රබන්ධාදීවූ වචනනැමති; වායුවෙග, පවන්වේගයෙන්; සංකුලි, ආකුලවූ; යසො, කීර්තිනැමති; හිමෙ, තුහිනනිපාතඇති; දෙවරාජ, විශිෂ්ටාධිපතිරාජ නැමති; නිබ්බලී, නිශ්චලවූ; හිමාවලො, හිමාලපර්වතය; විරාජතෙ, විරාජමානවන්නේසි.

98 සීහරාජපවරෙන සන්තතං පාලිතා ගරිගුණා සථා තථා
තස්ස හත්ථතලපත්තබාණතො සීහලා අයංම්හු සුරක්ඛිතා.

සීහරාජපවරෙන, සිංහරාජොත්තමයෙකුවිසින්; සන්තතං, නිරන්තරයෙන්; පාලිතා, රක්ෂිතවූ; ගරිගුණා, ස්වර්ණගුණයක් සථා, සම්සේද; තථා, එපරිද්දෙන්; තස්ස, ඒ විශිෂ්ටාධිපරාජයාගේ; හත්ථතලපත්ත, ශ්‍රීහස්ත තලයටපැමිණියාවූ; බාණතො, ස්වර්ණ බඩයෙන්; අයංසීහලො, මේසිංහලවිජයතොම; සුරක්ඛිතොඅහු, සුරක්ෂිතවූයෙවි.

99 ලඞ්කාපයොනිධිවිරාජිතහොරුරජ්ජං
නිච්චං ජනාන සුරගෙ ගතපක්ඛිරජ්ජං
නිස්සෙසවෙරි දිරදෙ ජිතසීහරජ්ජං
සො කිත්තාතසෙ වරවගිසන දෙවරජ්ජං.

ලඞ්කා, ලඞ්කාද්වීපසංඛ්‍යාත; පයොනිධි, ක්‍ෂීරසාගරයාගේ; විරාජිත, බැබලීමට; හොරුරජ්ජං, ස්වර්ණගිරිරාජන්වූ; නිච්චං, සන්තතයෙන්; ජන, සත්වයන්ගේ; අනග, අනඞ්ගසංඛ්‍යාත; උරගෙ, සර්පයන්; ගත, නැසීමට; පක්ඛිරජ්ජං, සුපර්ණරාජන්වූ; නිස්සෙසවෙරි, සමස්තවෛරීසංඛ්‍යාත; දිරදෙ, හස්තින්; ජිත,

ජයගැනීමට; සීහරාජං, මෘගරාජයක්හුබඳුවූ; වර, උත්කෘෂ්ටවූ; විජිතභාදෙවරාජං, විශිෂ්ටඅදිව්‍යරාජයා; සො, ඒ පරාක්‍රමබාහුරජතෙම; කිත්තනායෙ, කීර්තනයකරන්නේය හෙවත් අභිමතාර්ථ සිද්ධියපිණිස සිහිකරන්නේයි.

100 දුද්දිසීකොලූකවිලොචනාතපං
සන්දිසීකානෙකචකොරචන්දිකං
දෙවතාමච්චතිලොකවිත්තකං
පාලෙහි දෙවින්දමුනින්දසාසනං.

දුද්දිසික, මිථ්‍යාදෘෂ්ටිනැමැති; උලූක, හුංකාරපක්ෂීන්ගේ; විලොචන, නෙත්‍රයන්ට; ආතපං, සූර්‍ය්‍යාතපයක්වැනිවූ; සන්දිසික, සම්‍යක්දෘෂ්ටිනැමැති; අනෙකචකොර, නොයෙක්ජිහලපක්ෂීන්ට; චන්දිකං, චන්ද්‍රිකාකාන්තියක්වැනිවූ; සදෙවතාමච්ච, දිව්‍යමනුෂ්‍යයන්සහිතවූ; තිලොක, තුන්ලොවට; විත්තකං, ඓශ්වර්‍ය්‍යවූ; මුනින්දසාසනං, සර්වඥසාසනය; දෙවින්ද, භවත්දිව්‍යරාජය; පාලෙහි, පස්වාදහසක්රක්ෂාකර.

101 විසුද්ධහදපජනතලෙ තව දිස්සමානං
සාමච්චමණ්ඩලපරක්කමබාහුරාජං
සෙනඞ්ගනංගිත අයාමියලොචනෙහි
සම්මාවිලොකිය සුරාධිප පාහි නිච්චං.

සුරාධිප, දිව්‍යරාජෝත්තමය; තව, තොපගේ; විසුද්ධහදපජනතලෙ, සිත්නැමැති දර්පනතලයෙහි; දිස්සමාන, දක්නාලබන්නාවූ; සාමච්චමණ්ඩල, අමාත්‍යමණ්ඩලයාසහිතවූ; පරක්කමබාහුරාජං, පරාක්‍රමබාහුනරශ්‍රෙෂ්ඨයා; සෙනඞ්ගනංගිත, සෙනඟසංඛ්‍යාතරාංගනාලපඇති; අයාමියලොචනෙහි, කරුණාමයචක්ෂුන්කරණකොටගෙණ; සම්මාවිලොකිය, යහපත්කොට බලා; නිච්චං, සතතයෙන්; පාහි, රක්ෂාකර.

102 බහුජනපුඤ්ඤභාවභූත වරසිරිසම්පන්නපාරිජාත
රවිකුලභූපාල භූමිභූත චිරං මවනිං පාහි දෙවරාජ.

බහුජන, අනල්පසත්වයන්ගේ; පුඤ්ඤභාවභූත, කුසලමයිමයෙන්පහළවූ; වරසිරිසම්පන්න, ප්‍රවරඓශ්වර්‍ය්‍යසම්බන්ධියෙන්; පාරිජාත, දෙවද්‍රුමාකාරවූ; රවිකුලභූපාල, සූර්‍ය්‍යවංශොත්පන්නපෘථිවීශ්වරයන්ට; භූමිභූත, ප්‍රතිෂ්ඨාධාරවූ; දෙවරාජ, පුලස්තිවංශොත්භූත විශිෂ්ටදිව්‍යරාජෝත්තමයානෙනි; අවනිං, සම්පූර්ණපෘථිවිය; චිරං, බොහෝකාලයක්; පාහි, රක්ෂාකර.

සරසිගාමිමූලමහාසාමිනො භාගිනෙය්‍යභූතෙන සත්‍යරාජපරිවෙණපතිපස්සිනා රචිතං වුත්තමාලසන්දෙසසතකං සමත්තං.

නිමි



